සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

වාර්ෂික වාර්තාව
2023-2024

පටුන

දැක්ම, මෙහෙවර සහ ආයතනික අරමුණු.....04

අරමුණු, කර්තව්‍යයන්, සේවාවන් සහ වසර තුළ ප්‍රගතිය.....05

සංස්ථාපිත තොරතුරු.....06

සභාපතිතුමාගේ පණිවිඩය.....07

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 08

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්.....09 - 10

නිෂ්පාදන කළඹ.....11 - 13

ව්‍යාපාර සමාලෝචනය.....14

රැකියා උත්පාදනය.....15

ආයතනික පාලනය.....16

විශේෂ මූල්‍ය සිදුවීම්.....17

විශේෂ මූල්‍ය සිදුවීම්වල ප්‍රස්ථාරික නිරූපණය.....18 - 19

සංස්ථාවේ අංශයන්හි කාර්යසාධනය.....20 - 21

විගණකාධිපති වාර්තාව.....22 - 33

විස්තීරණ ආදායම් ප්‍රකාශනය.....34

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව.....35

ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය.....36

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....37 - 38

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.....39 - 55

දැක්ම, මෙහෙවර සහ ආයතනික අරමුණු

අපගේ දැක්ම

දේශීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම

අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාවට ආසියාවේ වාණිජ කේන්ද්‍රස්ථානය වීමට සහාය වීමේ අරමුණින්
පාර්ශවකාර අභිලාෂ පවත්වා ගනිමින් අනෙකුත් සියලු අංශවල අවශ්‍යතා සපුරාලන අතර
මූලිකවම රාජ්‍ය අංශයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස
ඊට අවශ්‍ය සියලු නිෂ්පාදන හා සේවා සැපයීම.

ආයතනික අරමුණු

සාධාරණ ඉපැයුම් ඉපැයීම, පුද්ගල හා වෘත්තීය සංවර්ධනයට දායකවීම සහ
විශේෂිත සන්නාම හරහා නිෂ්පාදන නායකත්වය ස්ථාපිත කිරීම.

අරමුණු, කර්තව්‍ය, සේවාවන් සහ වසර තුළ ප්‍රගතිය

මෙහෙයුම් අරමුණු

- විවිධත්වයෙන් යුතු භාණ්ඩ හා සේවා විකුණුම තුළින් වෙළඳපොළ ස්ථාවර කිරීම.
- කීර්තිමත් සහ විශ්වසනීය ජාත්‍යන්තර සන්නාම අප රට තුළ නියෝජනය කිරීම.
- ආයතනයේ ආදායම සහ ලාභය වර්ධනය කිරීම මගින් එහි කීර්තිනාමය ස්ථාපිත කිරීම.
- රාජ්‍ය අංශයේ අවශ්‍යතා ඵලදායීව සැපයීම මගින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම.
- ආයතනයේ ප්‍රධාන නිෂ්පාදන හරහා පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම පිණිස ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති, පාරිභෝගිකයන් සහ කාර්යමණ්ඩලය කෙරෙහි නිරන්තර අවධානය යොමුකිරීම මගින් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.

මෙහෙයුම් උපායමාර්ග

- පාරිභෝගික පදනම සහ ප්‍රවේශ්‍යතාව පුළුල් කිරීම.
- පාරිභෝගික අවශ්‍යතාවය අනුව නිෂ්පාදන කළඹ ඉහළ නැංවීම.
- ව්‍යවසාය සම්පත් කළමනාකරණය පද්ධතිය තුළින් වෙබ් සබල ව්‍යාපාරික කළමනාකරණය සහ දත්ත කළමනාකරණය සහ ප්‍රසම්පාදන අනුමතිය.
- ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයන්හි සක්‍රීය සහ සුවිල සහභාගිත්වය.

වසර තුළ ප්‍රගතිය

මෙම වසරේ ආයතනයේ ව්‍යාපාරික ආදායම රු. මිල 12,132 ක් ලෙස වාර්තා විය. සමාලෝචිත වර්ෂය තුළ අනෙකුත් මෙහෙයුම් ආදායම රු. මිලියන 57කි. බදු පූර්ව ශුද්ධ ලාභය රු. මිලියන 1501 ක් **ලෙස පෙන්නුම් කළ** අතර මුළු ස්කන්ධ ප්‍රමාණය වසර තුළ රු. මිලියන 6170 දක්වා වැඩි වුණි.

2024 මාර්තු අවසන් වන විට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 300 ක් විය.

නිෂ්පාදන ආයතන සමග හවුල්කාරිත්වයෙන් අපගේම STC සන්නාමය සහිත නිෂ්පාදන ස්ථාපිත කිරීමට අප සැලසුම් කර ඇති අතර නිෂ්පාදන මාලාවක් සැලසුම් කරමින් පවතී.

සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම : සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

නෛතික තත්ත්වය : 1970 අංක 33 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (එස්.ටී.සී) වෙළඳ ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. එය 1982 අංක 17 දරන පොදු සමාගම් පනත යටතේ සී/ස ලංකා ජෙනරල් ට්‍රේඩින් සමාගම ලෙස නීතිගත කරන ලද අතර, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සී/ස ලංකා ජෙනරල් ට්‍රේඩින් සමාගම 2010/10/01 දින සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ලෙස වෙනස් කරන ලදී.

2023/2024 මූල්‍ය වර්ෂය තුළ, සමාගම මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට අනුබද්ධව පැවතුනි.

සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂක : ආසිරි වලිසුන්දර මහතා - (2022.09.05 සම්බන්ධ විය)

අධ්‍යක්ෂක මණ්ඩලය :

ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතා	-	(2020.01.20 දින සම්බන්ධ විය)
ජී. දහනායක මහත්මිය	-	(2022.02.05 දින සම්බන්ධ විය)
ටී. ඒ. ඩී. රංජිත් මහතා	-	(2022.09.09 දින සම්බන්ධ විය)
සී. පීරිස් මහතා	-	(2022.11.12 දින සම්බන්ධ විය)
කේ. ආර්. එස්. පෙරේරා මහතා	-	(2023.01.20 දින සම්බන්ධ විය)
කේ. සත්‍යකුමාර් මහතා	-	(2023.03.02 දින සම්බන්ධ විය)

සමාගම් ලේකම් : ඒ. ඩබ්ලිව්. මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම

විගණක : විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
අංක. 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

බැංකුකරුවන් : මහජන බැංකුව
ජාතික සංවර්ධන බැංකුව
සම්පත් බැංකුව
ලංකා බැංකුව

ලියාපදිංචි කාර්යාලය : 100, නවම් මාවත,
කොළඹ - 02,
ශ්‍රී ලංකාව.
දුරකථනය : +94 112 422341-4, +94 112 440880
ෆැක්ස් : +94 112 447970
විද්‍යුත් තැපෑල : lankagen@sltnet.lk
වෙබ් අඩවිය : www.stc.lk

සමාගම් ලියාපදිංචි අංකය : PB 863

සේවක සංඛ්‍යාව : අවසන් වූ වර්ෂය තුළ සමාගම විසින් සේවකයන් 300 දෙනෙකු සේවයේ යොදවන ලදී.

සභාපතිතුමාගේ පණිවිඩය

රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ 2023/2024 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගෞරවයකි.

• බාහිර පාරිසරික බිහිදසුන

ශ්‍රී ලංකාව 2022 වර්ෂයේ පටන් ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටින අතර එම වර්ෂය තුළ දළ දේශීය නිෂ්පාදිතය (GDP) තුළ සෘණ ආර්ථික වර්ධනයක් වාර්තා කළා ය. කෙසේ වුවද, 2023 වර්ෂයේ දෙවන අර්ධය තුළ ශ්‍රී ලාංකික ආර්ථිකය යලි ඉහළ නැගීමක් සංඥා කළ අතර 2023/2024 මූල්‍ය වර්ෂය ආරම්භයේදී, දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) සෘණ වර්ධනය පහත හෙලන ලදී. මෙම ආර්ථික ප්‍රකෘත වීමට පුනර්ජීවනය වූ සාර්ව*ආර්ථික ස්ථාවරත්වය, ලිහිල්වෙමින් පැවති පොළී අනුපාතිකය සහ විදේශීය ක්ෂේත්‍රයේ පීඩනය ලිහිල් වීම ඉවහල් විය.

රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විචක්ෂණ මූල්‍ය කළමනාකරණය හා විවෘතභාවය ඇති කර ගැනීමෙහිලා රජයට සහයෝගය ලබා දුන් අතර එමගින්, ශ්‍රී ලංකා රජයට ආර්ථික අර්බුදය මගහරවා ගනු පිණිස මහජන විශ්වාසය යථා තත්ත්වයට පැමිණවීම සහ වඩා යහපත් මහජන සේවාවන් සැපයීම සිදු විය.

• කාර්යසාධන සමාලෝචනය

රජය ආර්ථිකය ඉහළ නැංවීමට උත්සාහ කරන කලෙක, රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සිය ඉතිහාසය තුළ ඉහළම බදු පෙර ශුද්ධ ලාභය වූ රුපියල් බිලියන 1.5 ක ලාභයක් වාර්තා කළ බව සතුටින් දැනුම් දෙන අතර බද්දට පසු ලාභය රුපියල් මිලියන 963 ක් විය. එය 2022/2023 මූල්‍ය වර්ෂය සමග සන්සන්දනය කළ විට 81% ක වර්ධනයකි. ඒ සමානව ම, 29% ක වැඩිවීමක් පිළිබිඹු කරමින් සමාගමේ වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියන 12 ට ළඟා වූයේ 16% ක දළ ලාභාන්තිකයක් වාර්තා කරමිනි. රේඛීය අමාත්‍යාංශය, සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය හා සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථා කළමනාකාරිත්වය විසින් ගන්නා ලද නිවැරදි හා කාලෝචිත තීරණ මෙම ජයග්‍රහණයට මූලික විය.

කෙටිකාලීන ආයෝජන තුළ ආයෝජනය කිරීම සහ සමාගමේ මුදල් ප්‍රවාහය සළුලදායී ලෙස කළමනාකරණය කිරීම වැනි ක්‍රියාමාර්ග හරහා ශුද්ධ මූල්‍ය ආදායම රුපියල් මිලියන 205 දක්වා වර්ධනය කර ගැනීමට අපට හැකි වූයේ ආර්ථිකය තුළ විචලනය වන පොළී අනුපාතිකයන්හි වාසි පූර්ණ ලෙස යොදා ගැනීම හේතුවෙනි.

යල් පිනූ හා මන්දගාමී ව්‍යාපාර වස්තු බැහැරණය කිරීමට වැඩිදුර පියවර ගනු ලැබූ අතර, ණය ප්‍රතිපත්තියට දැඩි ලෙසම අනුගත වීම මගින් ණය කාලපරිච්ඡේදය අවම කොට, මුදල් ප්‍රවාහය ශක්තිමත් කිරීමට අවස්ථාව උදා විය.
සමාගමේ 2024 මාර්තු 31 වැනි දිනට කාර්ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 300 ක් විය.


• සමාජ වගකීම්

රජයේ ප්‍රධාන වෙළඳ ආයතනය වශයෙන් සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව රජය විසින් පාලනය කරන ලද මිල මට්ටම්වලින් මිල ගණන් පවත්වා ගෙන යාම සහතික කිරීම හරහා පාරිභෝගික භාණ්ඩවල සිල්ලර වෙළඳපල මිල ගණන් ස්ථාවර කිරීමෙහිලා ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කර ඇත. තවද, ආර්ථික අවපාතය මධ්‍යයේ පවා සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව අඛණ්ඩ ලෙස පාරිභෝගික අවශ්‍යතාවන් සපුරා තිබේ.

• 2024/2025 සඳහා අනාගත සැලසුම්

- රජයට වෙළඳපල මිලගණන් ස්ථාවර කිරීමට අවශ්‍ය අවස්ථාවන්හිදී අවශ්‍ය පරිදි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම හා බෙදා හැරීම සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීම.
- දැනට ඇති නිපැයුම් කළඹට නව නිෂ්පාදන හඳුන්වා දීම මගින් අතිරේක අලෙවි වර්ධනයක් සාක්ෂාත් කර ගැනීම.
- ගනුදෙනුකාර ප්‍රජාව තව තවත් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන දක්වා ව්‍යාප්ත කිරීම මගින් පිරිවැටුම වැඩි කිරීම.

මෙම ආයතනයේ අභිවෘද්ධිය උදෙසා මාගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ හා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ අඛණ්ඩ සහයෝගය පතන අතරම, ගරු මුදල් ඇමතිතුමාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ දූරදර්ශී මාර්ගෝපදේශකත්වය සම්බන්ධයෙන් මාගේ හෘදයංගම ප්‍රශංසාව පිරිනමනු කැමැත්තෙමි. එමෙන්ම මෙම මූල්‍ය වර්ෂය මුළුල්ලේ අපගේ ගමනට උර දුන් අපගේ බැංකුකරුවන්ට හා සියලූම පාර්ශ්වකරුවන්ට ස්තුති කිරීමටත් ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය පැතීමටත් මම මෙය අවස්ථාවක් කර ගනිමි.



ආසිරි වලිසුන්දර
සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් වන අපි 2024 මාර්තු 31 වැනි දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වූ එම සංස්ථාවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ ශේෂ පත්‍රය සමඟින් මෙම වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

ප්‍රධාන ක්‍රියාකාරකම්
සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ ආයතනයන්හි කාර්යාලීය අවශ්‍යතා සම්බන්ධයෙන් වෙළඳ කටයුතුවල නියැලී සිටියි. අපගේ නිෂ්පාදන කළඹට කාර්යාල සැපයුම් හා උපකරණ, ගෘහ උපකරණ, තොරතුරු තාක්ෂණ හා විදුල් සංදේශ උපාංග, විදුලි හා විද්‍යුත් උපාංග, සීඝ්‍ර පරිභෝජන භාණ්ඩ, වාහන ටයර් හා බැටරි, කෘෂිකාර්මික උපකරණ හා මෙවලම්, අභ්‍යන්තර ගෘහ නිර්මාණ හා කාර්යාලීය ගෘහභාණ්ඩ, රසායන ද්‍රව්‍ය සහ අත්‍යවශ්‍ය ආහාර ඇතුළත් වන අතර තීරුබදු රහිත මෙහෙයුම් ද ක්‍රියාත්මක කෙරේ. එයට අමතරව, යම් භාණ්ඩවල සැපයුම් හා මිල ගණන් නියාමනය කරනු පිණිස සිල්ලර වෙළඳපලට මැදිහත්වීමට රජයට අවශ්‍ය වන පරිදි ඒ ඒ අවස්ථාවන් හි දී, සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ප්‍රධාන ආනයනිකයා සහ බෙදාහරින්නා ලෙස කටයුතු කරයි. එම පදනම මත මෙම සමාගම සහල් හා බිත්තර ආනයනය කිරීමට සම්බන්ධ වූ අතර එම කාරයය සාර්ථකව ඉටු කර තිබේ.

අධ්‍යක්ෂවරු
මෙම වාර්තාවේ දිනට අධ්‍යක්ෂ තනතුරු හොබවන්නන් වාර්ෂික වාර්තාවෙහි සංස්ථායික තොරතුරු තුළ සඳහන් කෙරෙන පරිදි වේ.

මූල්‍ය ප්‍රතිඵල
මූල්‍ය ප්‍රතිඵලවලින් 2023/2024 වර්ෂය සඳහා වූ පිරිවැටුම හා ශුද්ධ ලාභය යන අංශවලින් ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

	පිරිවැටුම රු. මිලියන	දළ ලාභය රු. මිලියන	ශුද්ධ ලාභය රු. මිලියන
2023/2024 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය	12,132.03	1,967.21	1,498.93

කොටස් නිකුතුව * එකක් රු. 10/* බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන 10 කි.

සමාගමෙහි ප්‍රාග්ධන ව්‍යුහයෙහි වෙනස්කම් සිදු වී නොතිබුණි. 2023/2024 කාලපරිච්ඡේදය තුළ නව කොටස් නිකුත් කොට නොතිබුණි.

ලාභාංශය
2023/2024 වර්ෂය සඳහා රු. මිලියන 102.5 ක අතුරු ලාභාංශයක් ගෙවා තිබුණි.

සංචිත හා ප්‍රතිපාදන
2023/2024 මූල්‍ය වර්ෂය තුළ ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාලීය උපකරණ, පරිගණක, මෙවලම් හා උපකරණ, සහ ගෘහභාණ්ඩ හා සවිකිරීම් ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අතර එමඟින් රු. 3,615,021,487 ක ප්‍රත්‍යාගණන සංචිතයක් නිර්මාණය විය.

වෙළඳ තොග හා ණයගැතියන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 අනුව මූල්‍ය ප්‍රකාශ තුළට අපචය ප්‍රතිපාදන අන්තර්ග්‍රහණය කරන ලදී. ඒ අනුව, අවුරුදු 5 කට වැඩි ණය ගැති ශේෂයන් සඳහා පූර්ණ වශයෙන් අපචය ප්‍රතිපාදනය කරන ලද අතර, යම් අය කර ගැනීමක් සිදු වේ නම්, අදාළ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ තුළ එයට අනුරූපී ගැලපුම් සිදු කෙරේ.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්
2023/2024 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් හතරක් පවත්වන ලද අතර කමිටුවේ සභාපති ලෙස කටයුතු කළේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරන භාණ්ඩාගාරයේ නියෝජිතවරයා ය. 2023/2024 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් ලෙස පත් කරන ලදුව එය නියෝජනය කළ සාමාජිකයින් පහත සඳහන් වේ.*

අධ්‍යක්ෂවරයාගේ නම	විගණන හා කළමනාකරණ කමිටුව තුළ දැරූ තනතුර
කේ. සත්‍යකුමාර මහතා	සභාපති
දුලාන් හෙට්ටිආරච්චි මහතා	සාමාජික
ගිල්මා දහනායක මහත්මිය	සාමාජික

විගණන කාර්යයේ විෂය පථය ආවරණය කරන අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් විසින් සිය රැස්වීමේ දී අනුමත කරන ලදී. එසේ අනුමත කරන ලද සැලැස්ම නිති සමාලෝචනය කොට ප්‍රගතිය සංක්ෂේප කරන ලදී.

සේවක සංඛ්‍යාව
මූල්‍ය වර්ෂය අවසානය වන විට සමාගමේ සේවක සංඛ්‍යාව 300 ක් වූ අතර ඉහළ කළමනාකාරිත්වයේ 6 දෙනෙකුගේ, මධ්‍යම කළමනාකාරිත්වයේ 8 දෙනකුගේ හා කණිෂ්ට කළමනාකාරිත්වයේ 16 දෙනකුගේ සංයුතියකින් සමන්විත විය.

විගණකවරු
මෙම කාර්යය අඛණ්ඩව ඉටු කරනු පිණිස රෙගුලාසියක් මඟින් විගණකාධිපතිවරයා යලි පත් කරන ලදී.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්


සභාපති


අධ්‍යක්ෂ

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	නම
සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ	ආසිරි වලිසුන්දර මහතා
සාමාන්‍යාධිකාරී	චමිලා ඉද්දමල්ගොඩ මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලවි	එම්. එන්. මහේෂ් මෙන්ඩිස් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය	අයි. එම්. ඩී. කේ. ඉලංගසිංහ මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන	සඳරුවන් පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය	චතුර ගයාන් පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන	නිරෝෂ් බණ්ඩාර මහතා

අංශ ප්‍රධානීන්

රසායන ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන අංශය
කළමනාකරු — කේ. එච්. ගුණවර්ධන මහතා

කාර්යාල උපකරණ සැපයුම් අංශය
කළමනාකරු — නිමල්කා රණසිංහ මිය

ගෘහ උපකරණ අංශය
කළමනාකරු — ගයාන් බෝගහවත්ත මහතා

තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය
සහකාර කළමනාකරු — මධුක බණ්ඩාර මහතා

විදුලි හා විද්‍යුත් උපකරණ අංශය
කළමනාකරු — කේ. ජී. සී. ජනක මහතා

කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හා උපකරණ අංශය
කළමනාකරු — මධුශානි අකුරුගොඩ මිය

ඉදිකිරීම්, ලෝහ භාණ්ඩ සහ කාර්යාල ගෘහභාණ්ඩ අංශය
සහකාර කළමනාකරු — අනුරුද්ධ මහේෂ් මහතා

වාහන නිපැයුම් අංශය
සහකාර කළමනාකරු — ඩී. ප්‍රදීප් කුමාර මහතා

පාරිභෝගික භාණ්ඩ අංශය
සහකාර කළමනාකරු — ඩී. ප්‍රදීප් කුමාර මහතා

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්

අංශ ප්‍රධානීන්	නම
තීරු බදු රහිත වෙළඳ අංශය	
සහකාර කළමනාකරු	කේ. ජී. සී. ජනක මහතා
ප්‍රසම්පාදන අංශය	
කළමනාකරු	ධනුෂ්ක පුෂ්පකුමාර මහතා
මූල්‍ය අංශය	
කළමනාකරු	අයි. කේ. පී. පී. පෙරේරා මිය
කළමනාකරු (වැඩ බලන)	පී. ආර්. ඩී. පීරිස් මිය
සහකාර කළමනාකරු	ඒම්. ඊ. ඉලිපන්ගමුව මෙනෙවිය
තොරතුරු තාක්ෂණ අංශය	
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වැඩ බලන)	නිරෝෂ් බණ්ඩාර මහතා
සේවා සහ සැපයුම් අංශය	
සහකාර කළමනාකරු	කේ. එච්. අනුපමා පීරිස් මිය
විගණන අංශය	
සහකාර කළමනාකරු - අභ්‍යන්තර විගණන	ඒම්. මදූෂා අමාලි ඩයස් මිය
මානව සම්පත් හා නීති අංශය	
නීති නිලධාරිණී	ලක්මාලි කුලරත්න මිය
කළමනාකරු - මානව සම්පත්	දර්ශනා පතිරණ මිය

ශාඛා සහ ප්‍රදර්ශනාගාර

01. නවම් මාවත ප්‍රදර්ශනාගාරය	අංක 100, නවම් මාවත, කොළඹ 02.
02. කුරුණෑගල ප්‍රදර්ශනාගාරය	අංක 243/3/1, පුත්තලම් පාර, කුරුණෑගල.
03. මහනුවර ප්‍රදර්ශනාගාරය	අංක 449, විලියම් ගොපල්ලව මාවත, නුවර.
04. මාතර ප්‍රදර්ශනාගාරය	අංක 11, YMCA ගොඩනැගිල්ල, දුම්රියපල පාර, මාතර.
05. අනුරාධපුර ප්‍රදර්ශනාගාරය	අංක 561-B, 38 4වෙනි පටුමග, අනුරාධපුර.
06. යාපනය ප්‍රදර්ශනාගාරය	අංක 127, MPCS ගොඩනැගිල්ල, කන්කසන්තුරේ පාර, යාපනය.
07. මඩකලපුව ප්‍රදර්ශනාගාරය	අංක 32A සහ 32B, නව කල්මුනේ පාර, මඩකලපුව.

අපේ නිෂ්පාදන කළඹ



කාර්යාල සැපයුම් හා උපකරණ

ඩබල් A සහ අනෙකුත් ජායා පිටපත් කඩදාසි, පුවරු, කඩදාසි වර්ග, පොත්, ෆයිල් කවර හා ෆෝල්ඩර, ලියුම් කවර, කාර්යාල බෑග් සහ බ්‍රීෆ්කේස්, පෑන් සහ පැන්සල්, වයිට් බෝඩ්, සලකුණු කිරීමේ පෑන්, කතුරු, කඩදාසි කැපීමේ පිහි සහ කඩදාසි තිරු කිරීමේ යන්ත්‍ර, කැල්කියුලේටර, ස්ටේප්ලර් සහ සිදුරුකරන, සීඩී තැටි සහ ඩීවීඩී තැටි, යූඑස්බී ඩ්‍රයිව් සහ අනෙකුත් ලිපි ද්‍රව්‍ය.

ගෘහ උපකරණ

ඇළුමිනියම් භාණ්ඩ, පෝසිලේන් නිෂ්පාදන, නන්ස්ටික් මුළුතැන්ගෙයි භාණ්ඩ, සියලු අකාරයේ පිරිසිදු කිරීමේ නිෂ්පාදන, ක්‍රීඩා භාණ්ඩ, සියලු ආකාරයේ ප්ලාස්ටික් නිෂ්පාදන, කෝප්ප සහ පීරිසි, හැඳි ගෑරුප්පු පිහි ආදිය සහ පිඟන් බඩු, කේතල සහ ජෝග්ගු, රාක්ක සහ බන්දේසි, උණු වතුර බෝතල්, ජල පෙරණ සහ පිරිසිදුකාරක, කොට්ට, මෙට්ට සහ ඇඳ ඇතිරිලි, රබර් සහ කොහු පාපිසි, කිරුම් උපකරණ, වැහි කබා සහ කුඩ, අත්පිස්නා, කඩදාසි අත්පිස්නා, අනෙකුත් කඩදාසි නිෂ්පාදන සහ බිත්ති ඔරලෝසු.





තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන උපාංග

ලැප්ටොප් පරිගණක, ඩෙස්ක්ටොප් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, යුපීඑස්, ජායා පිටපත් යන්ත්‍ර, අනෙකුත් පරිගණක උපාංග.

විදුලි සහ විද්‍යුත් උපාංග

වායු සමීකරණ යන්ත්‍ර, KDK විදුලි පංකා, ඩිජිටල් කැමරා (නිශ්චල,විඩියෝ) සහ දීප්තිමත් ආලෝක බල්බ, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ තිර, ගෘහස්ථ හා එළිමහන් ස්පීකර, ඕඩියෝ ඇම්ප්ලිෆයර, මික්සර් සහ මයික්‍රොෆෝන, විදුලි උත්පාදක යන්ත්‍ර, ප්‍රවේශ පාලන පද්ධති, CCTV පද්ධති, ඇඟිලි සලකුණු යන්ත්‍ර, විදුලි පහන් (CFL, ෆ්ලොරසන්ට්) සහ හදිසි අවස්ථා ලාම්පු, දුරකථන, විදුලි රැහැන් ඇදීමේ උපාංග, අනෙකුත් විදුලි උපාංග.





අපේ නිෂ්පාදන කළඹ



වේගයෙන් අළෙවි වන පාරිභෝගික භාණ්ඩ

ගෙදර දොර සෞඛ්‍ය පවත්වා ගැනීමට අවශ්‍ය නිෂ්පාදන, පුද්ගල සනීපාරක්ෂක භාණ්ඩ සහ ආහාර වර්ග.

ටයර් සහ වාහන බැටරි

EXIDE
APOLLO DUNLOP MRF
YOKOHAMA NANKANG







කෘෂිකර්ම උපකරණ, යන්ත්‍රෝපකරණ මෙවලම් සහ ලෝහ භාණ්ඩ

කටු කම්බි, පඳුරු කපන යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර, වෑද්දුම් ට්‍රාන්ස්ෆෝමර, කැති සහ පිහි, සියලු වර්ගයේ බල මෙවලම්, සියලු වර්ගයේ අත් මෙවලම්, ජල පොම්ප, ආරක්ෂිත උපකරණ (හිස් ආවරණ, අත්වැසුම් සහ බූට් වර්ග), මුල්ලු, අලවංගු, සවල් සහ රේක්ක, පොලිතින් සීලර්, ධූමන යන්ත්‍ර.

අපේ නිෂ්පාදන කළඹ





අභ්‍යන්තර සැලසුම් නිර්මාණ සහ කාර්යාල ගෘහ භාණ්ඩ

වානේ ගෘහ භාණ්ඩ, (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක) දැව ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක) මෙලමයින් ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක)

රසායන ද්‍රව්‍ය

කර්මාන්ත රසායන ද්‍රව්‍ය, පරීක්ෂණාගාර රසායන ද්‍රව්‍ය, විශේෂ රසායන ද්‍රව්‍ය, තෝරා ගත් පුපුරණ රසායන ද්‍රව්‍ය






තීරු බදු රහිත සාප්පුව


විදේශිකයින් සඳහා අවශ්‍ය පහසුකම් සපයයි.

ව්‍යාපාර සමාලෝචනය

විකුණුම් වර්ධනය (රු. මිලියන)



ආදායම් බදුවලට පසු ශුද්ධ ලාභය (රු. මිලියන)



රැකියා උත්පාදනය

2019 - 2024

2019/2020 සිට 2023/2024 දක්වා රැකියා උත්පාදනය

2019 - 2020



මුළු සේවකයන් 398

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 211
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 187

2020 - 2021



මුළු සේවකයන් 374

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 169
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 205

2021 - 2022



මුළු සේවකයන් 392

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 185
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 207

2022 - 2023



මුළු සේවකයන් 336

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 154
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 182

2023 - 2024



මුළු සේවකයන් 300

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 171
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 129

ආයතනික පාලනය

පාලන ව්‍යුහය සහ යහපත් ව්‍යාපාරික පරිචයන් යළි පණගැන්වීමට පසුගිය වසර තුළ කළමනාකාරිත්වය ප්‍රයත්න දරන ලදී. ඊට අමතරව, සංස්ථාව සතුව වෙනම විගණන අංශයක් ඇති අතර මනා පාලන පරිසරයක් සහතික කිරීම පිණිස අභ්‍යන්තර පාලන ස්ථාපිත කර තිබේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන වෙනම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබේ. රජයේ ප්‍රසම්පාදන පටිපාටි අනුව ප්‍රසම්පාදන යාන්ත්‍රණය අධීක්ෂණය සහ පාලනය පිණිස ටෙන්ඩර් මණ්ඩලයක් ස්ථාපිත කොට ඇත..

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ

සභාපති / ක.අ.
ආසිරි වලිසුන්දර මහතා
(2022.09.05 දින සම්බන්ධ විය)

- **කේ. සත්‍යකුමාර් මහතා** අධ්‍යක්ෂ
- **ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතා** අධ්‍යක්ෂ
- **සී. පීරිස් මහතා** අධ්‍යක්ෂ
- **කේ.ආර්.එස්. පෙරේරා මහතා** අධ්‍යක්ෂ
- **ජී. දහනායක මහත්මිය** අධ්‍යක්ෂ
- **ටී. ඒ. ඩී. රංජිත් මහතා** අධ්‍යක්ෂ

විගණන කමිටු සාමාජිකයෝ

කේ. සත්‍යකුමාර් මහතා
කමිටුවේ සභාපති

- **ජී. දහනායක මහත්මිය** අධ්‍යක්ෂ
- **ඩී. ජේ. විදානච්චි මහතා** අධ්‍යක්ෂ

- 2023/2024 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහතුනක් (13) සහ විගණන කමිටු රැස්වීම් හතරක් (4) පවත්වා ඇත.

ව්‍යාපාර කළමනාකරණ මෙවලම් පැවැතීම



1) ආයතනික සැලැස්ම 2022/2027
2) වාර්ෂික වාර්තාව 2022/2023
3) STC ප්‍රසම්පාදන පටිපාටි
4) STC ක්‍රියාකාරී සැලැස්ම
5) STC නිෂ්පාදන කළඹ
6) STC පැතිකඩ
7) STC ණයට විකුණුම් ප්‍රතිපත්තිය
8) තොග පාලන ප්‍රතිපත්තිය
9) STC අනමත සේවක සංඛ්‍යාව


විශේෂ මූල්‍ය සිදුවීම්

	2023/2024 (රු. 000)	2022/2023 (රු. 000)	වෙනස% ↑/↓
මෙහෙයුම්			
පිරිවැටුම	12,132,030	9,416,776	29%
පොළී සහ බදුවලට පෙර ඉපැයුම්	1,293,575	383,501	237%
බදු පෙර ලාභය	1,498,934	731,165	105%
බදු පසු ලාභය (ප්‍රත්‍යාගණන ලාභයට පෙර)	963,204	532,775	81%
ශේෂ පත්‍රය			
ජංගම නොවන වත්කම්	4,118,664	632,397	551%
ජංගම වත්කම්	4,457,573	4,213,431	6%
ජංගම වගකීම්	2,246,377	2,885,147	-22%
ජංගම නොවන වගකීම්	160,198	178,433	-10%
ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත	6,169,663	1,782,247	246%
මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	- 1,078,218	153,186	-804%
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්	- 1,377,136	92,532	-1588%
ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	351,599	115,616	204%
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	836,298	- 711,081	-218%
කොටසක් සඳහා දත්ත			
කොටසක ඉපැයුම්	97	54	80%
කොටසක ශුද්ධ වත්කම්	617	178	246%
හිමිකම් මත ඵලය (ROE)	0.74	0.36	105%
වත්කම් මත ඵලය (ROA)	0.68	0.12	468%
වැදගත් අනුපාත			
දළ ලාභ අනුපාතය	16%	11%	5%
ශුද්ධ ලාභ අනුපාතය	12%	8%	4%
ක්ෂණික අනුපාතය	1.50	0.95	58%
ජංගම අනුපාතය	1.98	1.46	36%
තෝලන අනුපාතය	0.19	0.07	176%

විශේෂ මූල්‍ය සිදුවීම් ප්‍රස්ථාරික නිරූපණය


පිරිවැටුම

වර්ෂය	(රු. මිලියන)
14/15	3862
15/16	2949
16/17	3749
17/18	4334
18/19	3474
19/20	2454
20/21	2677
21/22	8750
22/23	9417
23/24	12132




බදු පූර්ව ශුද්ධ ලාභය

වර්ෂය	(රු. මිලියන)
14/15	11
15/16	31
16/17	61
17/18	82
18/19	-32
19/20	-125
20/21	47
21/22	482
22/23	731
23/24	1499




මූළු වත්කම

වර්ෂය	(රු. මිලියන)
14/15	3051
15/16	2694
16/17	2650
17/18	2994
18/19	2796
19/20	2493
20/21	2515
21/22	5917
22/23	4846
23/24	8576




ශුද්ධ වත්කම


වර්ෂය	(රු. මිලියන)
14/15	695
15/16	707
16/17	759
17/18	820
18/19	786
19/20	651
20/21	701
21/22	1131
22/23	1782
23/24	6170



කොටසක ඉපැයුම් (රු)




හිමිකම් මත ඵලය(රු.)



සංස්ථාවේ අංශයන්හි කාර්යසාධනය

ආදායම් උත්පාදකයන් 2023 - 2024




ආදායම් උත්පාදකයන්ගේ කාර්යසාධනය 2023/2024

අංශය	විකුණුම්	ද.ලා	ද.ලා%
රසායන ද්‍රව්‍ය	678,199,226	256,076,265	38%
තො.ස.තා.	660,086,111	77,400,522	12%
කාර්යාලීය සැපයුම්	393,593,416	72,604,137	18%
මෝටර් රථ අංශය	229,435,930	36,052,117	16%
තීරු බදු රහිත සාප්පුව	11,575,579	4,062,009	35%
විද්‍යුත් සහ විදුලි උපකරණ	2,307,097,373	417,224,615	18%
විශේෂ ව්‍යාපෘති අංශය	103,543,497	18,048,362	17%
ගෘහ උපකරණ	167,150,581	25,508,804	15%
ඉදිකිරීම් ද්‍රව්‍ය	175,294,346	22,639,130	13%
අත්‍යවශ්‍ය ආහාර, කෘෂි යන්ත්‍රෝපකරණ හා උපකරණ	7,302,373,880	1,015,679,940	14%
ස්වශක්ති	103,679,769	21,916,044	21%
එකතුව	**12,132,029,706**	**1,967,211,946**	**16%**


වෙළඳ අංශ කාර්යසාධනය සංසන්දනය (2022- 2023 / 2023-2024)

ශේෂය	2022/2023		දළ ලාභය%	2023/2024		දළ ලාභය%	% ↑ / ↓		
	විකුණුම්	දළ ලාභය		විකුණුම්	දළ ලාභය		විකුණුම්	ද.ලා	ද.ලා%
ර.ද්‍ර	989,466,830	336,774,106	34%	678,199,226	256,076,265	38%	-31%	-24%	4%
තො.ස.තා	358,777,332	24,780,251	7%	660,086,111	77,400,522	12%	84%	212%	5%
කා.සැ.	372,467,640	110,702,911	30%	393,593,416	72,604,137	18%	6%	-34%	-11%
මෝටර් රථ	242,593,285	32,367,653	13%	229,435,930	36,052,117	16%	-5%	11%	2.4%
තී.බ.ර. සාප්පුව	19,268,522	6,009,146	31%	11,575,579	4,062,009	35%	-40%	-32%	4%
වි.වි. උපකරණ	213,499,779	32,480,523	15%	2,307,097,373	417,224,615	18%	981%	1185%	3%
වි.ව.අ.	105,450,290	17,868,546	17%	103,543,497	18,048,362	17%	-2%	1%	0%
ගෘ.උ	400,374,661	64,927,777	16%	167,150,581	25,508,804	15%	-58%	-61%	-1%
ඉදිකිරීම් ද්‍රව්‍ය	268,200,300	31,077,606	12%	175,294,346	22,639,130	13%	-35%	-27%	1%
අත්‍ය. ආහාර, කෘෂි. යන්ත්‍ර හා උප.	6,378,694,690	349,158,110	5%	7,302,373,880	1,015,679,940	14%	14%	191%	8%
ස්වශක්ති	67,982,942	13,112,918	19%	103,679,769	21,916,044	21%	53%	67%	2%
එකතුව	**9,416,776,272**	**1,019,259,548**	**11%**	**12,132,029,706**	**1,967,211,946**	**16%**	**29%**	**93%**	**5.39%**

වෙළඳ අංශයන්හි ආදායම් සංසන්දනය



වෙළඳ අංශයන්හි දළ ලාභ සංසන්දනය



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } වීඑසී/ඩී/එස්ටීඩී/එෆ්ඒ/2023/24/17 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 ඔක්තෝබර් 30 දින

සභාපති,

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ ("සමාගමේ") 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01හි 32 ඡේදය අනුව වත්කම් හා වගකීම් හිලවු කර නොදැක්විය යුතු වුවද, රු.373,351,128ක් වූ වෙළඳ ණයගිම් ශේෂයට රු.11,906,646ක් වූ ලැබිය යුතු ශේෂ හිලවු කර ශුද්ධ වටිනාකම වූ රු.361,444,482ක් ගෙවිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 16 ඡේදයට පටහැනි ලෙස ස්ථාවර තැන්පතු හා වෙනත් කෙටිකාලීන තැන්පතුවල සිදු කර තිබූ ශුද්ධ ආයෝජන රු.315,088,866ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම වෙනුවට මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ දක්වා තිබුණි. තවද මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රාජ්‍ය ප්‍රදාන වලට අදාළ විලම්බිත ආදායම් රු.24,437,682ක් දෙවරක් අඩුකර දක්වා තිබීමෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය අනුව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගීව නිවැරදි කළ යුතු අතර ප්‍රමිතියෙහි 49 ඡේදය අනුව වැරදි නිවැරදි කිරීම සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. එසේ වුවද සමාගම විසින් එම ප්‍රමිතියේ විධිවිධානවලට පටහැනිව පෙර වර්ෂයේ සහල් ආනයනයට අදාළ විනිමය ලාභ රු. 440,670,002ක් හා විනිමය අලාභ රු. 27,863,304ක් සහ එම සහල් ආනයනයට අදාල වියදම් හා තොග හානි එකතුව රු. 23,869,693ක් සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැයට පිළිවෙළින් බැර සහ හර කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 අනුව මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ දැක්විය යුතු රු.30,437,267ක් වූ විලම්බිත බදු වගකීම්, ජංගම නොවන වත්කම් වලින් අඩුකර ශුද්ධ විලම්බිත වත්කම් ලෙස දක්වා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි 39 ඡේදය අනුව රාජ්‍ය ප්‍රදාන ගිණුම් කැඩීමේ ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. තවද ප්‍රමිතියේ 26 ඡේදය අනුව රාජ්‍ය ප්‍රදාන වටිනාකම් අදාළ වත්කම්වල ඵලදායී ජීවකාලය පුරා ක්‍රමානුකූලව බෙදා හැර සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් විලම්බිත ආදායමක් ලෙස හඳුනාගැනීම වෙනුවට එම ආදායම්

රු.24,437,668ක් වත්කම් ක්ෂය ගිණුමට බැර කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ආදායම හා ක්ෂය වියදම් එම ප්‍රමාණයෙන් ඌනගණනය වී තිබුණි.

(ඊ) කල් ඉකුත් වූ වයින් තොග වෙනුවෙන් දැරූ වියදම් රු.4,285,347ක් හා රාජ්‍ය ආයතන වෙත නොමිලේ බෙදාදුන් 2015 වර්ෂයේ මිලදීගත් ජංගම වී ගබඩා 22ක පිරිවැය රු.42,351,980ක් සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැයට හර කර තිබීම හේතුවෙන් දළ ලාභය රු.46,637,327කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) භෞතික තොග සත්‍යාපනයේ දී හඳුනාගන්නා ලද තොග අධිමාන සහ නිවැරදි කිරීම්වල එකතුව රු.23,064,553ක් පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීමක් ලෙස විකුණුම් පිරිවැයෙන් අඩුකර පෙන්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් විකුණුම් පිරිවැය අඩුවෙන් සහ දළ ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2017 සිට 2024 දක්වා කාලපරිච්ඡේදය තුල බාහිර පාර්ශවයන් විසින් බැංකුව වෙත සිදු කර තිබූ එකතුව වූ රු.2,820,094ක් වූ සෘජු නැන්පතු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට වෙනත් ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(එ) මඩකලපුව රජවාස ගොඩනැඟිල්ලෙහි කොටසක් ලංකා සතොස ලිමිටඩ් ආයතනයට උප බදු දීම වෙනුවෙන් සමාගමට ලැබිය යුතු රු.7,279,191ක් වූ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කළ ප්‍රේෂණ අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාජ සංරක්ෂණ දායක බදු වියදම් රු.83,347,166ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.86,942,743 ක් ලෙස දක්වා තිබීමෙන් රු.3,595,577ක වෙනසක් පැවතුණි.

(ඔ) විකුණුම් වටිනාකම් එකතුකල අගය මත බදු වාර්තා අනුව රු. 12,643,327,250ක් සහ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 12,132,029,706ක් වීමෙන් එම වටිනාකම් අතර රු. 511,297,543ක වෙනසක් පැවති අතර ගැනුම් වටිනාකම් එකතුකල අගය මත බදු වාර්තා අනුව රු. 3,733,542,154ක් හා මූල්‍ය ප්‍රකාශන අනුව රු. 9,796,491,313ක් වීමෙන් එම අගයන් අතර රු.6,062,949,159 ක වෙනසක් පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස්

කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා, දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,

- චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) අංක PED 1/2015 දරන 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 ඔක්තෝබර් 05 දිනැති අංක : PED/S/STC/03/11(i) දරන ලිපිය	චක්‍රලේඛ විධිවිධාන වලට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබූ ප්‍රතිපූර්ණ ක්‍රමවේදයට පටහැනිව නිල වාහන සඳහා හිමිකම නොමැති ස්ථිර පදනමින් බඳවාගත් නිලධාරීන් 42 දෙනෙකුට සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 09 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී පිළිවෙළින් රු.2,711,750ක සහ රු.972,500ක මාසික ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.
(ආ)2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි	
(i) 3.2 (i) ඡේදය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව උත්සව හා දිරි දීමනා ලෙස රු.41,679,289 ක්, වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය සඳහා රු.3,846,978 ක් හා මරණ පාරිතෝෂික ලෙස රු.700,000 ක් සේවකයන්ට ගෙවා තිබුණි.
(ii) 6.7 ඡේදය	ස්ථාවර වත්කම් සහ ගබඩා සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති රු.977,631,425 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2017 වර්ෂයෙන් පසුව භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

(ඇ)2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (iii) ඡේදය

නැව මඟින් භාණ්ඩ ආනයනය කරනු ලබන සියළුම රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ ප්‍රවාහන කටයුතු සී/ස නැව් ලංකා සංස්ථාව හරහා සිදුකල යුතු අතර නැව් සංස්ථාවේ නැව් ගාස්තුව අපනයනකරුගේ නැව් ගාස්තුවට වඩා වැඩිවන විට ඒ බව දැක්වෙන අත්හැරීමේ නිවේදනයක් ලිඛිතව ලබාගත යුතු වුවද නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ අවස්ථා 18කින් අවස්ථා 16කදී විදේශීය නැව් සමාගම් හරහා ආනයන කටයුතු සිදුකර තිබූ අතර එහිදි අත්හැරීම් නියෝග ලබාගෙන තිබුනේ අවස්ථා 2කදී පමණි. ඒ අනුව ඇමරිකන් ඩොලර් 22,479ක මුදලක් විදේශීය නැව් සමාගම් වලට ගෙවා තිබූ බැවින් රට තුළින් විදේශ විනිමය ගලායාමක් සිදුවී තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නීරික්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) සහ (ඇ) ප්‍රකාරව ආයතනයේ මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රධාන හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ප්‍රාග්ධන මිලදීගැනීම් වෙනුවෙන් ප්‍රසම්පාදන ව්‍යදම් ඇස්තමේන්තුවක් පමණක් පිළියෙල කර තිබුණි.

(ආ) විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීමෙන් තොරව පෞද්ගලික ආයතනයකට රු.3,144,025ක් ගෙවා ආයතනයේ එළිමහන් පරිශ්‍රයේ කොටසක් තාරදමා කාපට් කර තිබුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ අවශ්‍යතාවය සඳහා රු.98,550,332ක් වටිනා තොරතුරු තාක්ෂණික උපකරණ මිලදී ගෙන සවිකර තිබුණි.

(ඇ) 2023 ජනවාරි 03 දිනැති අංක අමප/22/2100/601/014/111 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් බිත්තර ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී වටිනාකම රු.496,000,000ක් වූ බිත්තර

18,420,480ක් ආනයනය කර තිබුණි. එහිදී රු.මිලියන 200 ට වැඩි මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 අනුව පත්කළ යුතු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙනුවට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මඟින් ප්‍රසම්පාදන කාර්යය සිදුකර තිබුණි. තවද ආනයනික බිත්තර නිශ්කාශණය හා ගබඩා කිරීමේ ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.4.8 අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර හා මාර්ගෝපදේශ 8.9.1 අනුව සේවා සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත් වටිනාකම රු.5,987,529ක් වූ තිරු බදු නිදහස් සාප්පුව අළුත්වැඩියා කිරීමේ ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.4 අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සමාගම විසින් 2015 වර්ෂයේ දී පිරිවැය රු.96,254,510ක් වූ වී තොග රැස් කිරීමේ ජංගම ගබඩා (Cocoon) 50ක් පිලිපීනයෙන් ආනයනය කර ඒවායින් ඒකක 15ක් පමණක් අලෙවිකර තිබුණි. වර්ෂ 7කට අධික කාලයක් නොවිකිණී පැවති පිරිවැය රු.25,026,173ක් වූ ඒකක 13ක් 2022 වර්ෂයේදී හා පිරිවැය රු.42,351,984ක් වූ ඒකක 22ක් සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආයතනවලට නොමිලේ බෙදා දී තිබූ බැවින් සමස්ත ව්‍යාපෘතියේ අලාභය රු.67,378,157ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනට සමාගමේ අනුමත කාර්යය මණ්ඩලය 315ක් වූ අතර තක්සා කාර්යය මණ්ඩලය 286ක් වූයෙන් එදිනට පුරප්පාඩු 77ක් පැවතුණු අතර ඒ තුළ විධායක මට්ටමේ පුරප්පාඩු 10ක් විය. මීට අමතරව 48 ක අතිරික්ත කාර්ය මණ්ඩලයක් පැවතුනි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ආදායම් වැඩි කර ගැනීම සඳහා සැලසුම් කළ ක්‍රියාකාරකම් 04ක් ක්‍රියාත්මක කර තිබුණද ළඟා කරගෙන තිබූ ආදායමේ වර්ධනය සියයට 50ක් පමණක් විය. භාණ්ඩ හා සේවා සැපයුම් ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා සැලසුම්කර තිබූ ක්‍රියාකාරකම් 14ක් අතරින් ක්‍රියාකාරකම් 11ක් ක්‍රියාත්මක කර නොතිබූ බැවින් මුළු ක්‍රියාකාරකම් සමඟ සැසඳීමේදී ඉටු කළ ක්‍රියාකාරකම් ප්‍රමාණය සියයට 21ක් පමණක් විය. තවද පාසල් ළමුන් සඳහා මූලික පරිගණක හඳුන්වා දීම හා පරිගණක ආශ්‍රිත නව අයිතම හඳුන්වාදීම යන ව්‍යාපෘති 2හි ප්‍රගතිය පිළිවෙලින් සියයට 17ක් හා සියයට 4ක් පමණක් විය. අවම වශයෙන්

එක් භාණ්ඩයක් හෝ එක් වෙළෙන්දෙක් විදේශීය වෙළඳපලට ඇතුලත් කිරීම අරමුණු කර තිබුණද එය ද ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී Q-Shop අලෙවිසැල් 08ක් කුළුබඩු සංස්ථාව වෙත කුලී පදනම් මත ලබා දීමට කුලී ගිවිසුමක් ඇතිකරගෙන තිබුණු අතර අලෙවිසැල් 03ක් විගණිත දිනය වූ 2024 ජූලි 25 දින වන විටත් භාර දී නොතිබුණි. ඒ හේතුවෙන් රු.920,000 ක කුලී ආදායමක් අහිමි වී තිබූ අතර නිශ්කාර්යව පැවති එම අලෙවිසැල් 3 වෙනුවෙන් බාහිර පාර්ශවයන්ට ගෙවා තිබූ රු.480,000ක කුලිය නිෂ්කාර්ය වියදමක් විය. මෙම Q - Shop ව්‍යාපෘතිය තුළින් සමාලෝචිත වර්ෂයේදී රු.1,658,668ක අලාභයක් ලබා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනට රු.822,322,109 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුල වර්ෂ 2 සිට 5 දක්වා පැරණි රු.133,352,935ක ශේෂ ද වර්ෂ 5ට වැඩි කාලයක් තිස්සේ පවතින රු.177,479,439ක ශේෂ ද පැවති අතර එම ණය ශේෂ අයකරගෙන නොතිබුණි. තවද රු. 1,272,905,763ක් වූ අනෙකුත් ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් දීර්ඝ කාලයක සිට පවතින රු. 13,421,973ක අය නොවූ ශේෂයක් විය.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනට ලැබූ අත්තිකාරම් වල වටිනාකම රු.25,491,248ක් වූ අතර අවුරුදු 3ට වැඩි කාලයක සිට නොපියවන ලද අත්තිකාරම් ශේෂවල වටිනාකම රු. 7,837,353ක් විය.

(උ) සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනට රු.361,444,482ක් වූ ණයහිමි ශේෂය තුල වර්ෂ 5ට වැඩි කාලයක් ගත වී තිබුණ ද නිරවුල් නොකල ශේෂය රු.90,514,335ක් විය. තවද රු.716,930,302 ක් වූ අනෙකුත් ගෙවිය යුතු ශේෂ තුල ඇතුළත් දීර්ඝකාලීනව පවතින රු.15,789,605ක ශේෂවල නිවැරදිභාවය තහවුරු කරගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනට ගබඩාවේ පැවති පිරිවැය රු.685,725,364ක් වූ තොගයෙහි ඇතුළත් වර්ෂයකට වැඩි කාලයක් තුල චලනය නොවූ තොග වටිනාකම රු. 155,109,130ක් වූ අතර මෙම තොග අතරින් කල් ඉකුත් වීමට ආසන්න තොග හඳුනාගැනීමට යෝග්‍ය ක්‍රමවේදයක් ගිණුම්කරණ පද්ධතිය තුල ස්ථාපනය කර නොතිබුණි.

(එ) සමාගම විසින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් කුලී පදනම් මත ලබාගෙන තිබූ වේයන්ගොඩ ගබඩාව 2023 පෙබරවාරි සිට 2024 පෙබරවාරි දක්වා නිශ්කාර්යව පැවතියද රු.2,400,000ක බදුකුලියක් ගෙවා තිබුණි.

(ඒ) මඩකලපුව රජවාස ව්‍යාපෘති සඳහා 2021 සැප්තැම්බර් සිට 2023 ජූනි දක්වා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබූ අතර එම ගොඩනැගිල්ල

නවීකරණය කිරීම 2024 ජූලි 30 වන විටත් අවසන් වී නොනිබීම හේතුවෙන් කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර එම දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ රු.5,720,000ක කුලිය නිශ්කාර්ය වියදමක් විය.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී නාරාහේන්පිට රජවාස වෙළෙඳ ප්‍රදර්ශනාගාර ව්‍යාපෘතියේ බදු ගිවිසුම ප්‍රකාරව මාසික විදුලි බිල්පත්, ජල බිල්පත් හා දුරකථන බිල්පත් ඇතුලු සේවා ගාස්තු දෙවන පාර්ශවය විසින් දැරිය යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල විදුලි වියදම් සහ ජල ගාස්තු වශයෙන් රු.6,102,278 ක් එනම්, ව්‍යාපෘති ආදායමෙන් සියයට 48 ක් සමාගම විසින් දරා තිබුණු අතර ව්‍යාපෘතියෙන් රු.5,180,344ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. මෙම ගොඩනැගිල්ල තුල අලෙවි ප්‍රදර්ශනාගාර 25ක් පවත්වාගෙන යාමට ඉඩපහසුකම් පැවතියද ක්‍රියාත්මකව පැවති ප්‍රදර්ශනාගාර 21 න් 11ක් පමණක් රාජ්‍ය ආයතන විය. ඒ අනුව "රාජ්‍ය ආයතනවල නිෂ්පාදනය කරනු ලබන හා අලෙවි කරනු ලබන නිෂ්පාදන දැරිය හැකි මිලකට එකම වහලක් යටදී පාරිභෝගිකයන්ට ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම" යන ව්‍යාපෘතියේ මූලික අරමුණ කරා ලහා වී නොතිබුණි.

(ඕ) පොලිස් විශේෂ කාර්යය බලකාය වෙත බදු දී ඇති සමාගමට අයත් රාජගිරියේ පිහිටි ගොඩනැගිල්ල සහිත ඉඩම සඳහා 2024 ජනවාරි 01 දින සිට බදු ගිවිසුමකට එළඹ නොතිබුණ අතර පූර්ව ගිවිසුම ප්‍රකාරව 2024 ජනවාරි සිට අගෝස්තු මාසය දක්වා ලැබිය යුතු බදු කුලිය වූ රු.14,400,000ක් අයකර ගෙන නොතිබුණි. තවද ගිවිසුමේ 08 වැනි වගන්තියට පටහැනි ලෙස අවසරයකින් තොරව ස්ථිර ඉදිකිරීම් සිදු කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා

	සටහන්	2023/2024 රු.	2022/2023 රු.
ආදායම	03	12,132,029,706	9,416,776,271
විකුණුම් පිරිවැය		(10,164,817,761)	(8,397,516,723)
දළ ලාභය		1,967,211,946	1,019,259,548
අනෙකුත් මෙහෙයුම් ආදායම / (වියදම)	04	57,275,265	35,297,453
		2,024,487,211	**1,054,557,002**
බෙදා හැරීමේ වියදම්	05	221,093,107	233,327,415
පරිපාලන වියදම්	06	507,538,260	433,457,185
		728,631,367	**666,784,600**
පොළී සහ බදුවලට පෙර ඉපැයුම්		**1,295,855,843**	**387,772,401**
ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)	07	205,359,103	347,663,542
බදුකරණයට පෙර ලාභය/(අලාභය)		**1,501,214,947**	**735,435,943**
බදුකරණය	08	(535,046,293)	(199,671,154)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)		**966,168,654**	**535,764,789**
අනෙකුත් විස්තීරණ ආදායම			
සේවක ප්‍රතිලාභ මත ලාභ/(අලාභ)		(2,280,886)	(4,271,080)
අනෙකුත් විස්තීරණ ආදායම මත බදු		(684,266)	1,281,324
වත්කම් ප්‍රත්‍යාගණන ලාභය		3,615,021,486	113,699,964
අනෙකුත් විස්තීරණ ආදායම (අලාභ) - බදු අයකල පසු		**3,612,056,334**	**110,710,208**
වර්ෂය සඳහා සමස්ථ විස්තීරණ ආදායම (අලාභ) - බදු අයකළ පසු		**4,578,224,988**	**646,474,998**
කොටසක් සඳහා මූලික ඉපැයුම	09	97	54

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා

වත්කම්	සටහන්	2023 / 2024 රු.	2022 / 2023 රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	4,123,444,204	566,611,360
අස්පෘශ්‍ය වත්කම්	10a	8,025,000	9,330,001
කොටස් වල ආයෝජන	11	20	20
සේවකයන්ට ලබා දුන් ණය	12A	17,632,082	15,422,666
ශුද්ධ විලම්භිත බදු වත්කම	17	(30,437,267)	41,032,830
මුළු ජංගම නොවන වත්කම්		**4,118,664,040**	**632,396,876**
ජංගම වත්කම්			
තොග	13	1,089,692,167	1,467,189,374
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	14	1,911,080,785	1,030,577,057
සේවකයන්ට ලබා දුන් ණය - වත්මන් කල් පිරීම	12A	7,523,887	6,991,454
ස්ථාවර තැන්පතුවල කෙටිකාලීන ආයෝජන		1,358,308,950	1,668,700,000
කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - මහජන බැංකුව		18,688,366	25,266,927
කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - ජා.ස. බැංකුව		3,112,145	1,231,400
මුදල් හා මුදලට සමාන දෑ	15	69,166,814	13,474,352
මුළු ජංගම වත්කම්		**4,457,573,113**	**4,213,430,565**
මුළු වත්කම්		**8,576,237,152**	**4,845,827,423**

ස්කන්ධය සහ වගකීම

		2023 / 2024 රු.	2022 / 2023 රු.
ප්‍රාග්ධන සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.10 සාමාන්‍ය කොටස් මිලියන 10)		100,000,000	100,000,000
පොදු සංචිත		45,607,646	45,607,646
ප්‍රත්‍යාගණන සංචිත		3,969,829,684	354,808,198
අනෙකුත් සංචිත		(33,175,165)	(30,210,013)
රඳවාගත් ඉපැයුම්		2,087,400,340	1,312,041,000
මුළු ස්කන්ධ		**6,169,662,506**	**1,782,246,831**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	16	40,446,241	34,243,718
රජයේ ප්‍රදාන සහ විලම්භිත ආදායම් ගිණුම	21	119,751,820	144,189,502
මුළු ජංගම නොවන වගකීම්		**160,198,062**	**178,433,220**
ජංගම වගකීම්			
කෙටිකාලීන ණය ගැනුම්	18	791,639,266	13,600,000
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	19	1,103,866,032	2,765,607,414
බැංකු අයිරා	20	350,871,279	105,939,957
මුළු ජංගම වගකීම්		**2,246,376,578**	**2,885,147,370**
මුළු ස්කන්ධ සහ වගකීම්		**8,576,237,152**	**4,845,827,423**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි මූලික කොටස් බව සලකන්න. (වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)
මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා සමඟ අනුකූල වේ.

.....
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී.

.....
සභාපති

24.06.2024
.....
දිනය

.....
අධ්‍යක්ෂ

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	පොදු සංචිත රු.	අනෙකුත් සංචිත රු.	රඳවාගත් ලාභය/අලාභය රු.	එකතුව රු.
2022 අප්‍රේල් 1 වැනි දිනට ශේෂය	100,000,000	241,108,234	45,607,646	(27,220,257)	771,724,662	1,131,220,285
වසර සඳහා ශුද්ධ ලාභය/(අලාභය)	-	-	-		535,764,789	535,764,789
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ශුද්ධ ලාභය / (අලාභ) සහ බදු ශුද්ධ		-	-	(2,989,756)	-	(2,989,756)
පෙර වසරේ ගැලපුම්					4,551,548	4,551,548
වසර තුළ ප්‍රත්‍යාගණනය		113,699,964				113,699,964
2023 මාර්තු 31 දිනට ශේෂය	**100,000,000**	**354,808,198**	**45,607,646**	**(30,210,013)**	**1,312,041,000**	**1,782,246,831**
2023 අප්‍රේල් 01 දිනට ශේෂය	**100,000,000**	**354,808,198**	**45,607,646**	**(30,210,013)**	**1,312,041,000**	**1,782,246,831**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)	-	-	-	-	966,168,654	966,168,654
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ශුද්ධ ලාභ/(අලාභ) සහ බදු පසු	-	-	-	(2,965,152)	-	(2,965,152)
පෙර වසරේ ගැලපුම්	-	-	-	-	(809,314)	(809,314)
වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය	-	3,615,021,486	-	-	-	3,615,021,486
ලාභාංශ ගෙවීම (පෙර වර්ෂය)		-	-	-	(87,500,000)	(87,500,000)
ලාභාංශ ගෙවීම (වත්මන් වර්ෂය)					(102,500,000)	(102,500,000)
2024 මාර්තු 31 දිනට ශේෂය	**100,000,000**	**3,969,829,684**	**45,607,646**	**(33,175,165)**	**2,087,400,340**	**6,169,662,505**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි මූලික කොටස් බව සලකන්න.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා

	2023/2024 රු.	2022/2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	1,501,214,947	735,435,943
ගැලපීම්		
ක්ෂයවීම/ක්‍රමක්ෂය	71,820,585	47,682,310
පොළී ආදායම	(272,189,109)	(370,461,238)
රජයේ ප්‍රදාන විලම්භිත ආදායම් ගිණුම	(24,437,682)	-
කෙටිකාලීන ණය සහ අයිරා පොළිය	66,830,005	22,797,696
දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභය/(අලාභය)	-	(2,352,197)
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	1,482,000	1,326,000
තොග සහ ණයගැති කපාහැරීම්	503,478	-
ණයගැති හානිය	68,461,383	105,281,937
තොග හානිය	(13,893,794)	(17,209,276)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	11,918,676	6,623,591
පෙර වසරේ ගැලපුම්	(809,314)	4,551,548
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**1,410,901,176**	**533,676,315**
තොග භාණ්ඩ (වැඩිවීම)/ අඩුවීම	391,391,002	47,986,935
වෙළඳ ණයගැතියන් (වැඩිවීම)/අඩුවීම	(984,598,930)	214,966,603
රජයේ ප්‍රදාන විලම්භිත ආදායම (වැඩිවීම)/ අඩුවීම	(24,437,682)	(1,205,100)
ලැබිය යුතු ආනයනික සහල් මිල සහනාධාරය (වැඩිවීම)/අඩුවීම	-	1,209,838,823
පහසු ගෙවීම් ණය යෝජනා ක්‍රමයේ (වැඩිවීම)/ අඩුවීම	-	7,445
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	(1,871,473,562)	(1,852,085,415)
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්	**(1,078,217,996)**	**153,185,605**
ගෙවනු ලැබූ රඳවාගැනීමේ බද්ද	(18,196,251)	(1,655,756)
ගෙවනු ලැබූ ආදායම් බද්ද	(272,724,531)	(43,182,162)
ගෙවනු ලැබූ පාරිතෝෂික	(7,997,040)	(15,815,878)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලදී යොදාගත් ශුද්ධ මුදල්	**(1,377,135,818)**	**92,531,809**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත හා උපකරණ අත්කරගැනීම	(12,326,955)	(3,176,535)
ආයෝජන - නොනිමි වැඩ	-	(34,766,180)
බැහැරකිරීම්වලින් ලත් මුදල්	-	100,000
කෙටිකාලීන ආයෝජනවලින් ලැබුණු පොළිය	363,925,785	153,458,665
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්	**351,598,830**	**115,615,950**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
ස්ථාවර තැන්පතුවල ආයෝජන	310,391,050	(1,042,134,841)
කෙටි කාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - මහජන බැංකුව	6,578,561	339,009,420
කෙටි කාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - ජා.ස. බැංකුව	(1,880,745)	1,241,811
ශුද්ධ ණය ආපසු ගෙවීම් සහ උත්පාදන	778,039,266	13,600,000
ගෙවන ලද කෙටි කාලීන ණය සහ අයිරා පොළිය	(66,830,005)	(22,797,696)
ලාභාංශ ගෙවීම්	(190,000,000)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	**836,298,128**	**(711,081,307)**
මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	(189,238,861)	(502,933,548)
වසර ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ	(92,465,605)	410,467,943
වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ - (සටහන අ)	**(281,704,465)**	**(92,465,605)**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

සටහන අ - මුදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණය

	31.03.2024 දිනට රු.	31.03.2023 දිනට රු.
බැංකුවේ ඇති මුදල්		
ලංකා බැංකුව (ගිණුම් අංක 8859546)	270,158	270,158
සම්පත් බැංකුව (ගිණුම් අංක 000930000337)	1,218,404	1,354,218
සම්පත් බැංකුව (ගිණුම් අංක 002930006974)	508,313	-
ලංකා බැංකුව (ගිණුම් අංක 1060)	681,790	93,358
මහජන බැංකුව - කුරුණෑගල	1,011,200	1,015,315
මහජන බැංකුව - මාතර	2,425,851	1,006,750
මහජන බැංකුව - නුවර	1,824,267	1,312,850
මහජන බැංකුව - කල්මුණේ	3,110,331	1,000,000
ජාතික සංවර්ධන බැංකුව (ගිණුම් අංක. 101000160408)	235,845	478,506
මහජන බැංකුව - සහල් 180	377,929	614,901
මහජන බැංකුව - සහල් 004 1 0027 0206579	51,951	81,951
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	26,204	25,474
අතැති මුදල්		
සුළු මුදල් අග්‍රිමය	643,586	873,019
අතැති මුදල්	56,780,985	5,216,191
බැංකු අයිරා		
සම්පත් බැංකුව - DFS (ගිණුම් අංකය - 002930006974)	-	131,660
මහජන බැංකුව - (ගිණුම් අංකය 004100120210918)	(350,871,279)	(105,939,957)
	(281,704,465)	**(92,465,605)**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

1. පොදු විස්තරය

සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කොට ඇත.

මෙහි ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය අංක 100, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබයි.

ආයතනයේ ප්‍රධාන කර්තව්‍ය මෙහෙයුම් වෙළඳාම හා ප්‍රතිසම්පාදන කටයුතු වන අතර රාජ්‍ය අංශයේ ප්‍රධාන සැපයුම්කරුවෙකු ලෙස ද ආයතනය ක්‍රියා කරනු ලබයි.

2024 මාර්තු 31 වන දිනට ආයතනික ශ්‍රම බලකාය 300 කි. (2022/2023- 336)

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය

2.1 පිළියෙළ කිරීමේ පදනම

2.1.1 අනුගතවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නව ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියාමයන්ට අනුකූල වන අයුරින් සකස් කොට ඉදිරිපත් කර ඇත.

2.1.2 ඉදිරිපත් කිරීමේ පදනම

පහත දැක්වෙන අයිතමයන් හැර අනෙකුත් සියළුම අයිතම ගෙනහැර දක්වා ඇත්තේ "ඓතිහාසික පිරිවැය පදනම" පදනම් කර ගනිමිනි.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව, විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම වර්ථමාන අගයට පෙන්වා ඇත්තේ ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය පදනම් කර ගනිමිනි.

ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම් කටයුතු අධීක්ෂණයෙන් පසුව ආයතනයේ කටයුතු අනාගත කාල පරිච්ඡේදයක් සඳහා කරගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතු බව තහවුරු කර ඇත. එම නිසා අඛණ්ඩ පැවැත්ම නැමති සංකල්පය මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.

2.1.3 සංසන්දනාත්මක විශ්ලේෂණය

පසුගිය වසර වල මූල්‍ය ප්‍රකාශන වල අදාල ශේෂයන් ජංගම වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලින් සනාථ කිරීම සඳහා අවශ්‍ය විටදී නැවත වර්ගීකරණය කොට දක්වා ඇත.

2.1.4 ඇස්තමේන්තු සහ තීරණාත්මක ගිණුම්කරණ විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතයට ගෙන ඇති අතර මෙමගින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් කෙරෙහි සෘජු බලපෑමක් ඇති අවස්ථාවන්හි දී ප්‍රකාශයට පත් කරන ප්‍රකාශන සැබෑ තත්වයට වෙනස් විය හැකිය.

මෙම ඇස්තමේන්තු සහ උපකල්පන වාර්ෂිකව කළමණාකාරිත්වයේ සමාලෝචනයට පත්වන අතර එම අවස්ථාවන්හි දී ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදුකරන ලද ප්‍රතිශෝධන අදාල ගිණුම් වර්ෂයේ හඳුනා ගැනීම සහ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම සහ ඉදිරි ගිණුම් වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවලට ගනු ලබයි.
සටහන් අංක 16 - ගිණුම් කිරීමේ නිශ්චිත විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම.

මූල්‍ය ප්‍රකාශන සඳහා බලපාන උද්ධමනකාරී සාධක වලට ගැලපීම් සිදු කර නොමැත.
වැදගත් සහ සුදුසු ප්‍රතිපත්තීන් ඉදිරි සටහන්වල ඉදිරිපත් කර ඇත.

2.1.5 විදේශීය මුදල් ගණුදෙනු පරිවර්තනය

(අ) ඉදිරිපත් කොට භාවිතයේ ඇති සහ ක්‍රියාකාරී මුදල් ඒකකය

විදේශ මුදල් ගණුදෙනු ගිණුම්ගත කිරීමේ දී අදාල ගණුදෙනුව සිදු වූ දිනට පැවති විදේශීය හුවමාරු අනුපාතය පදනම් කර ගනු ලබයි. අදාල ගණුදෙනු පියවීමේ දී ඇති වූ ලාභ හෝ අලාභ පරිවර්තනය කර ඇත්තේ වසර අවසානයේ පැවති හුවමාරු අනුපාතයන්ට අනුවයි. ආයතනයේ ගිණුම් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. මෙය ශ්‍රී ලංකාව තුල ක්‍රියාකාරිත්වය දරණ මුදල් ඒකකය වේ.

(ආ) ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ දී අදාල දිනට පැවති විනිමය අනුපාතය අනුව ගලපා ගිණුම්වල දක්වා ඇත.

2.2 වත්කම් සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම

2.2.1 දේපල, පිරියත සහ උපකරණ

2.2.2 හඳුනා ගැනීම සහ මිනුම් කිරීම

ආයතනය විසින් ගොඩනගා ගත් වත්කම්වල අගය පෙන්වා ඇත්තේ ඒ වෙනුවෙන් දරන ලද අමු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ දරන ලද අනෙකුත් සෘජු වියදම් ද ඇතුලත්ව එම වත්කම් භාවිතයට ගත හැකි වන ආකාරයට පත් කර ගැනීමට දැරූ සියලු පිරිවැය ඇතුලත් අගයට වේ.

කිසියම් දේපල, පිරියත හා උපකරණ වර්ෂ කිහිපයක දී මිලට ගත් වත්කම් නම් එහි ඵලදායී ජීව කාලය බෙදා දැක්වීම කළ යුත්තේ ප්‍රධාන සංඝටකවල පැවැත්ම පදනම් කර ගනිමිනි.

දේපල, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය අගය අඩුකළ පසු අගය වාර්ෂික සමාලෝචනයට ලක්වන අතර කිසියම් වෙනස්කමක් සිදු වූව හොත් එම වෙනස්කමට අදාල පිරිවැය මත වූ ක්ෂය අගය අඩු කිරීමෙන් අනතුරුව එය ගෙන හැර දැක්වේ. එම ක්ෂය කල අගය අඩු කර නොහැකි අවස්ථාවල දී එම වත්කම මත වූ ක්ෂය ලියා හැර ඉන්පසු ඉතිරි වන අගය එම දේපල, එසේ නැත්නම් පිරියත, උපකරණ පොත් අගය ලෙස ගෙන හැර දක්වනු ලැබේ.

2024 වසරේදී සිදු කරන ලද ප්‍රත්‍යාගණනය මත පදනම්ව ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් ගත කර ඇත. එහි අගයෙහි කිසියම් වැඩිවීමක් සිදු වී නම් අනෙකුත් අදායම් ප්‍රකාශයේ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රත්‍යාගණන සංචිතයේ දක්වනු ලැබේ. එකම වත්කමේ පෙර වැඩිවීම් වලට හිලව් කර ඇති අගය අඩුවීම් හිමිකම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන සංචිතයට එරෙහිව අය කෙරේ. නැවත තක්සේරු කිරීමේ දිනයෙන් පසුව, ගොඩනැගිලි සඳහා අය කරනු ලබන සමුච්චිත ක්ෂයවීම් සහ හානි අවම කිරීම් අඩු කර, ඉඩම් සහ ගොඩනැගිලි සාධාරණ වටිනාකමකින් ගණනය කරනු ලැබේ.

පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි අලාභ අඩු කර පිරිවැයට දක්වා ඇත. නැවත ඇගයීම 2024 දී සිදු කර ඇති අතර ඒ අනුව අගයන් ප්‍රකාශ කර ඇත.

2.2.3 පසුව සිදුවූ පිරිවැය

දේපල, පිරියත හා උපකරණයන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද පිරිවැය හේතුවෙන් එහි ඵලදායී ජීව කාලය වැඩි වන්නේ නම්, එහි අගය ගණනය කළ හැකි නම් එවැන්නක් ගිණුම්ගත කරනු ලබන අතර එය ප්‍රාග්ධන වියදමක් ලෙස ගෙනහැර දැක්වේ. දේපල, පිරියත හා උපකරණ දෛනික භාවිතයේ දී සිදුවන වියදම් ගෙන දක්වනු ලබන්නේ ආයතනයේ ආදායම් ප්‍රකාශයෙහි වේ.

2.2.4 නොහඳුනා ගැනීම

දේපල, පිරියත හා උපකරණයන්හි ධාරණ පිරිවැය හඳුනා ගන්නා අතර එම වත්කම සඳහා ආර්ථික වටිනාකමක් නොමැති අවස්ථාවන්හි දී හෝ භාවිතයෙන් ඉවත් කර ඇති විට දී එය ආයතනය විසින් බැහැර කෙරේ. එහි දී ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

2.2.5 ක්ෂය

ආයතනයේ දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ දී එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබන්නේ, "සරල මාර්ග ක්‍රමය" යටතේ පිරිවැය හෝ ප්‍රත්‍යක්ෂිත වටිනාකමෙන් සුන්බුන් අගය අඩු කර ඵලදායී ජීවිත කාලය පුරාවට බෙදා හැරීමෙනි. ලීසිං පහසුකම් යටතේ ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ ලීසිං පහසුකම් සලසනු ලබන හෝ එම වත්කමේ ජීව කාලය යන අයිතම දෙකෙන් අඩු කාල සීමාවටයි. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්මන් සහ සංසන්දනාත්මක කාල සීමාවන් සඳහා ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය සහ ක්ෂය අනුපාත පහත දැක්වෙන පරිදි වේ.

ගොඩනැගිලි	7.5%
රථවාහන	20%
කාර්යාල උපකරණ	10%
ගෘහ භාණ්ඩ/සවිකිරීම්	10%
පරිගණක මෙවලම්	33.33%
ප්‍රදර්ශනාගාර උපකරණ	20%
බදුකර වත්කම් මත වියදම් දැරීම	කල්බදු කාල සීමාව හෝ ගොඩනැගිලි ක්ෂය කළ හැකි කාල සීමාව යන දෙකින් වඩා අඩු කාල සීමාව.

සෑම වසරකම ක්ෂය කරනු ලබන ක්‍රමය සහ අයිතමයන්ගේ ජීව කාලය සමාලෝචනය කර කළමනාකාරිත්වය විසින් මූල්‍ය වාර්තාවල ගෙනහැර දක්වනු ලබයි.

2.2.6 අස්පෘශ්‍ය වත්කම් (ශ්‍රීලගිප්‍ර 38)

2022/2023 වසර අවසානයේදී පරිගණක මෘදුකාංග පද්ධතිය ප්‍රත්‍යාගණනය කරනු ලැබීය. මෘදුකාංග පද්ධතියේ ප්‍රයෝජනවත් අනාගත ආයු කාලය වසර 3ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත. ප්‍රයෝජනවත් ආයු කාලය මත පදනම්ව, ක්ෂයවීම් අනුපාතය පහත පරිදි නිර්ණය කර ඇත. පරිගණක මෘදුකාංග පද්ධතිය 33.3%.

2.2.7 මූල්‍යමය ව්‍යුත්පන්න වත්කම් වර්ගීකරණය

ආයතනය මූල්‍යමය වත්කම් මෙසේ ගෙනහැර දක්වනු ලබයි. සාධාරණ අගය මත ලැබිය යුතු දෑ ලෙස සහ විකිණීම සඳහා කල්පිරුණු පසුව යන අයුරින් මෙම ඉදිරිපත් කිරීම සිදුවේ. කළමනාකාරිත්වය එම වත්කම් ප්‍රථමයෙන් ඉහත ලෙස වර්ගීකරණය කරනු ලබන අතර ආයතනය තුළ මෙම වර්ෂය තුල දී කිසිදු මූල්‍යමය වත්කමක් නොවීය.

2.2.8 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ මූල්‍යමය වත්කම් ලෙස දැක්වෙන අතර මෙම අයිතමවල වටිනාකම නිශ්චය කිරීමට වෙළඳපොල වටිනාකම් ගත නොහැක්කේ එය ක්‍රියාකාරී වෙළඳපොල තුළ සංසරණය නොවන බැවිනි. මෙම වත්කම් ජංගම වත්කම් වන අතර මාස 12 ට වැඩි කාලයකින් පසු කල් පිරෙන්නේ නම් ජංගම නොවන වත්කම් ගණයට අයත් වේ. ආයතනයේ ණය සහ ලැබිය යුතු දෑ, "වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ" ගෙන්ද සමන්විතයි. තවද මුදල් හා මුදල් වලට සමාන දෑ ද මෙහි පිළිඹිබු වේ.

2.2.9 මූල්‍ය මෙවලම් හිලව් කිරීම

මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් හිලව් කොට මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලබන්නේ එහි ශුද්ධ වටිනාකම අනුව වන අතර මෙසේ සිදු කිරීමේ අරමුණ වන්නේ මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් අගයන් එකවිට හිලව් කිරීමයි.

2.2.10 මූල්‍ය වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැය මත වත්කම්

ගිණුම්කරණ වර්ෂ අවසානයේ දී ආයතනයේ මූල්‍ය වත්කම්හි අගයේ හානිකරණයක් වීද යන වග සමාලෝචනය කරනු ලබයි. මෙහි දී හානිකරණය වීමට යම්කිසි හේතුදායකයක් සිදුවිය යුතු අතර අවක්ෂේපිත සාධකද මේ සඳහා තිබිය හැකියි. මෙමගින් ආයතනයේ මූල්‍ය වත්කම්වලට හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ මුදල් ප්‍රවාහයන්හට බලපෑමක් සිදුවිය හැකි වේ.

මෙයට හේතු ලෙස ණයගැතියන්ට නැවත ගෙවීමේ නොහැකියාව, වස්තු භංගත්වය හෝ මූල්‍ය ප්‍රතිසංවිධාන කටයුතු දැක්විය හැකියි. තවද, ආර්ථික වාතාවරණය, මූල්‍ය ප්‍රවාහයන් අඩු වීම කෙරෙහි බලපෑ හැකි මූලික සාධකයක් වේ. ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ හි අලාභයන් මනිනු ලබන්නේ වත්කමේ දැන් පවත්නා අගය සහ අනාගත මුදල් ප්‍රවාහවල අගය වට්ටම් කිරීමෙන් ලැබෙන අගය ගැනීමෙනි. වත්කම් අගය අඩු වන්නේ නම් එය ආදායම් ප්‍රකාශයේ ගෙනහැර දක්වේ.

2.2.11 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

කාල නිර්ණයන් නොමැති වත්කම් ක්‍රමක්ෂය සිදු කරනු නොලබයි. නමුත් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කෙරේ. ඉහත සඳහන් වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කරනු ලබයි. එහි දී වටිනාකමේ ඇතිවන වෙනස් වීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලබයි.

2.2.12 තොග

I තොග අගය කරන්නේ පිරිවැය හෝ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටයි. ශුද්ධ උපලබ්ධි අගය ගණනය කරන්නේ සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයන් යටතේ තොගය විකිණිය හැකි අගයෙන් පිරිවැය හා විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය. මූල්‍ය වර්ෂය සඳහා තොග සත්‍යාපනය වර්ෂ අවසානයේ සිදු කර ඇති අතර හානි වූ තොගයන් හඳුනා ගෙන ඇත. ශුද්ධ ලැබිය හැකි වටිනාකම ගිණුම්ගත කර ඇත.

වසරකට පෙර මිලදී ගනු ලැබූ තොග මුළු පිරිවැයෙන් 5% ක හානිකරණ ප්‍රතිපාදනයක් ලබා දීමෙන් පසුව ගිණුම්වලට ගෙන ඇත. වෙළඳපොළ මිල මට්ටම් පිරිවැය මිලට වඩා වැඩි බැවින් වසරක් තුළ මිලදී ගනු ලැබූ තොග පිරිවැයට ගණනය කර ඇත

II තොගයේ වටිනාකමෙන් විකුණුම් පිරිවැය ලෙස රු. 10,164,817,761 මෙම වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගෙන දක්වා ඇත.

III වෙළඳ තොගය සඳහා 5% ක අපහායන අලාභ ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇති අතර වෙළඳ තොගයේ මුල් වටිනාකම ලබා ගැනීමට ආයතනයට නොහැකි බවට සාධනීය සාක්ෂීන් ඇති විට වසරකට වඩා වැඩි තොගයන් සහ හානියට පත් තොගය සඳහා 5% අපහායන වෙන් කිරීමක් ප්‍රතිපාදනය කර ඇත.

IV ඇපකරයන් ලෙස ඇපයට තැබූ වත්කම්

1. ප්‍රතිපත්ති ප්‍රකාශනය
ණය පහසුකම් සඳහා ඇපයක් ලෙස ඇපයට තබා ඇති වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කෙරේ. ආයතනයේ මූල්‍ය බැඳීම් සහ අවදානම් පිළිබඳ පැහැදිලි බවක් ලබා දීම සඳහා ඇපයට තැබූ වත්කම් වර්ග, ධාරණ මුදල් ප්‍රමාණයන් සහ අනුරූප ණය පහසුකම් නිශ්චිතව දක්වා ඇත.

2. හෙළිදරව් කිරීම
ණය පහසුකම් ලබා ගැනීම සඳහා පහත වත්කම් මූල්‍ය ආයතනවලට ඇපයට තබා ඇත.

අ) තොග භාණ්ඩ

මූල්‍ය ආයතනයේ නම	උගස් වටිනාකම (රු.)
මහජන බැංකුව	220,490,000
සම්පත් බැංකුව	197,000,000
ජාතික සංවර්ධන බැංකුව	471,470,007

ආ) (i) ස්ථාවර තැන්පතු

මූල්‍ය ආයතනයේ නම	උගස් වටිනාකම (රු.)
මහජන බැංකුව	1,008,700.00

(ii) ගොඩ නැගූ ලාභාන්තිකය

මූල්‍ය ආයතනයේ නම	උගස් වටිනාකම (රු.)
මහජන බැංකුව	18,688,366
ජාතික සංවර්ධන බැංකුව	3,112,145

3. මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපෑම

මෙම වත්කම් ඇපයට තැබීම මූල්‍ය ප්‍රකාශනවල ඒවා පිළිගැනීමට බලපාන්නේ නැත, නමුත් අදාළ වගකීම් පියවන තෙක් ඇපයට තැබූ වත්කම් බැහැර කිරීමට සමාගමට ඇති හැකියාව එය සීමා කරයි. වාර්තා කරන දිනට මෙම ඇපයට තැබූ වත්කම්වල ධාරණ අගය පහත පරිදි වේ.

තොග භාණ්ඩ : රු. 888,960,007.00
ස්ථාවර තැන්පතු : රු. 1,008,700,000.00
ගොඩ නැගූ ලාභාන්තිකය : රු. 21,800,511.00

2.2.13 වෙළඳ ලැබිය යුතු දෑ

සමාගමට මුදල් හෝ වෙනත් මූල්ය වත්කමක් ලබා ගැනීමට ගිවිසුම්ගත අයිතියක් ඇති විට සහ පමණක්, සමාගම එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ ලැබිය යුතු දේ මූල්‍ය වත්කම් ලෙස හඳුනා ගනී.

ණය එකතු කිරීම වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

තුළ) අපේක්ෂා කරන්නේ නම්, ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ. වෙළඳ ලැබිය යුතු දේ අපේක්ෂිත උපලබ්ධිත වටිනාකමකට සිදු කරනු ලබන අතර, වසර අවසානයේ සියලුම හිඟ මුදල් ප්‍රමාණයන් සමාලෝචනය කිරීම මත පදනම්ව අඩමාන ලැබිය යුතු දේ සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලැබේ. බොල් ණය හඳුනාගත් වර්ෂය තුළ කපා හරිනු ලැබේ.

පහත සඳහන් නිර්ණායක මත පදනම්ව වෙළඳ ලැබිය යුතු දෑ හානි වීම සඳහා ප්‍රතිපාදන ස්ථාපිත කර ඇත.

- වසරකට වැඩි කාලයක් හිඟ ශේෂයන් ඇති ණය ගැතියන්ට 5% ක සාමූහික හානි වීමක් අදාළ වේ.

- වසර 5 කට වැඩි කාලයක් හිඟ ශේෂයන් ඇති ණය ගැතියන්ට 100% ක සම්පූර්ණ හානි වීමක් අදාළ වේ.

හිඟ මුදල් පසුව අයකර ගන්නා අවස්ථාවන්හිදී, අදාළ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අනුරූප ගැලපීම් සිදු කරනු ලැබේ.

2.2.14 ආයෝජන

(අ) දීර්ඝ කාලීන ආයෝජන

දිගුකාලීන ආයෝජන ජංගම නොවන ආයෝජන ලෙස වර්ග කර ඇති අතර ඒවායේ අගය පිරිවැය වෙයි. ආයෝජන අත්පත් කර ගැනීමේ පිරිවැය (මිලදී ගැණුම් පිරිවැය, තැරැව් ගාස්තු, හුවමාරු ගාස්තු) ද ඇතුලත්ව මුළු පිරිවැය ගණනය කරනු ලැබේ.

(ආ) කෙටිකාලීන ආයෝජන

කෙටි කාලීන ආයෝජන ශේෂ පත්‍ර දිනට පැවති වෙළඳ අගයට හඳුනා ගනු ලබයි. කෙටිකාලීන ආයෝජනයන් හි ලාභ අලාභ ආදායම් ප්‍රකාශයට ගනු ලැබේ.

2.2.15 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලින් ගම්‍ය වන්නේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ඉහල ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජන වේ. මෙහි දී මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී යොදා ගනු ලබන්නේ බැංකු අයිරාව හැර අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු පමණි.

2.2.16 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ආයතනයේ සියළුම කොටස් වල එකතුව එහි නාමික අගයෙන් වැඩි කිරීමෙන් ප්‍රකාශිත ප්‍රාග්ධනය ගණනය කොට ඇත.

මෙම ප්‍රකාශිත ප්‍රාග්ධනය පිළිබඳ හිමිකම, වගකීම දරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය සහ මුදල් අමාත්‍යාංශය මගින් වේ.

2.2.17 වෙළඳ ගෙවිය යුතු දෑ

සමාගම වෙළඳ ගෙවිය යුතු දෑ මූල්‍ය වගකීමක් සේ සලකනු ලබන අතර එය ශේෂ පත්‍රයේ ගෙවිය යුතු දෑ යටතේ සටහන් කරයි. මෙය සැපයුම්කරුවන් හා ඇති වූ ගණුදෙනු වල ප්‍රතිඵලයක් ලෙස ඇති වන්නා වූ මූල්‍ය වගකීමයි. සැපයුම්කරුවන්ගෙන් ලබාගත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් මුදල් හෝ තවත් එවැනි වත්කම් වලින් ආයතනය ගෙවිය යුතුය. වර්ෂයකට අඩු කාලයක දී ගෙවිය යුතු නම් ඒවා ජංගම වගකීම් වන අතර වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වේ නම් ඒවා ජංගම නොවන වගකීම් ගණයට අයත් වේ. වෙළඳ ණයහිමියෝ සාධාරණ අගය මත හඳුනා ගෙන ඇත.

2.2.18 ණය

ආයතනය ගනු ලබන ණය ප්‍රතිපාදන ප්‍රථමයෙන් සාධාරණ අගය මත හඳුනා ගනු ලබයි. පසුව මෙය ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගැනේ. තවද, වාර්ෂිකව සිදුකරනු ලබන ගෙවීම්, ආදායම් ප්‍රකාශයේ සටහන් වන අතර එහි වගකීම වසරකට වැඩි නම් ජංගම නොවන වගකීම් ලෙසත් වසරකට අඩු නම් ජංගම වගකීමක් ලෙසත් ශේෂ පත්‍රයේ දැක්වේ.

2.2.19 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය ශ්‍රීලගිප්‍ර. 20 ප්‍රකාරව සිදු කර ඇති අතර ගිණුම් සඳහා සටහන් 21 යටතේ හෙළිදරව් කර ඇත.

2.2.20 ආදායම් බදු

(අ) වර්තමාන බදු

වර්තමාන ආදායම් බදු ගණනය කර වෙන් කොට ඇත්තේ ව්‍යාපාරයේ මෙහෙයුම් අනුව 2017 අංක 24 දරණ ආදායම් බදු පනතේ නියමයන්ට අනුකූලවය.

(ආ) විලම්බිත බදු

විලම්බිත බදු තීරණය කරනු ලැබුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා සැලකිල්ලට ගනු ලබන වත්කම් හා බැරකම් වල ප්‍රමාණය, බදු වාර්තාකරණය සඳහා සැලකිල්ලට ගනු ලබන ප්‍රමාණය අතර තාවකාලිකව වෙනස මත ගණනය කිරීමෙනි. විලම්බිත බදු ගණනයේදී බදු ගාස්තු හා එයට අදාල නීති භාවිතයට ගෙන ඇත.

විලම්බිත බදු වත්කම් මත හඳුනා ගනු ලබන අතර එය ඉදිරි ගිණුම් වර්ෂවල දී ඇති විය හැකි ආයතනයේ ලාභය සමඟ හිලව් කොට දැක්වීම සඳහා භාවිත කරනු ලැබේ.

විලම්බිත බදු, බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීමේ දී නීත්‍යානුකූල බලාත්මක වන අයුරින් බදු වත්කම් බදු වගකීම් සමඟ හිලව් කෙරේ.

පමාකරන ලද බදු වත්කම සෑදී ඇත්තේ ආයතනයේ ඉදිරියට ගෙනෙන ලද බදු අලාභය හේතුවෙනි. මෙය ආයතනයේ ගිණුම් ප්‍රකාශවලට ගෙන නැත්තේ එය අය කරවා ගැනීමට සාමාන්‍ය බදු කාලසීමාවට වඩා කාලයක් ගතවන බැවිනි. මෙය සටහන්වල දක්වා ඇත.

(ඇ) පිරිවැටුම මත පදනම් වූ බදු

පිරිවැටුම පාදක බදුවලට එකතු කළ අගය මත බද්ද (VAT) සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ඇතුළත් වේ.

2.2.21 සේවක ප්‍රතිලාභ මත වූ පිරිවැය

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ලෙස හඳුන්වනු ලබන්නේ වෘත්තීය සේවා කාලය නිම වීමෙන් පසු ක්‍රියාත්මක වන නිශ්චිත දායකත්ව සැලසුම හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මකි. ශේෂ පත්‍රයේ ආයතනික වගකීම නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මගින් ගණනය කොට ඇත්තේ 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා ගෙවීම පිළිබඳ පනතට අනුව වේ.

සේවකයෙකු වෙත විශ්‍රාම දීමනා ගෙවීමේ වගකීම පැන නගිනුයේ වසර 5 ක පූර්ණ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවය. මෙම වගකීම ගිණුම් ප්‍රකාශනවල හඳුනා ගෙන ඇත. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ හිඟය හෝ අතිරික්තය වර්ෂය සඳහා ගණනය කරනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ට ප්‍රකාරව වන අතර යොදා ගත් උපකල්පන සටහන් අංක 17හි හෙළිදරව් කොට ඇත.

(ආ) සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

සියලුම සේවක, සේවිකාවන් අර්ථසාධක අරමුදල යටතේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල යටතේ ලියාපදිංචි කොට ඇති අතර අදාළ වර්ෂයේ දී එම සේවක සේවිකාවන් සඳහා ගෙවිය යුතු දායක මුදල රෙගුලාසිවලට අනුව සම්පාදනය කොට ඇත .

සියලුම සේවකයින් සඳහා වූ අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සම්බන්ධ දායකත්වය වියදම් සිදු වූ ආකාරයට ලාභ අලාභ සැකසීමේ දී හඳුනා ගත හැක .

2.2.22 ආදායම් හඳුනා ගැනීම

(අ) භාණ්ඩ විකුණුම් ආදායම

භාණ්ඩයක් විකුණුම් ලෙස හඳුනා ගනු ලබන්නේ පාරිභෝගිකයා වෙත භාණ්ඩයේ අවධානම සහ අයිතිය හුවමාරු වන අවස්ථාවේ දීය.

(ආ) සේවා සැපයුම් ආදායම

සේවා විකුණුම්වලින් ලත් ආදායම හඳුනා ගනු ලබන්නේ සේවාවේ ප්‍රතිලාභ හුවමාරු වූ අවස්ථාවේ දී වන අතර එම ආදායම අදාල ගිණුම් වර්ෂයේ දී හඳුනා ගැනේ.

(ඇ) පොළී ආදායම

පොළී ආදායම හඳුනා ගනු ලබන්නේ උපචිත පදනම මත වේ.

(ඈ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් ද උපචිත පදනම මත හඳුනා ගනු ලබයි.

(ඉ) දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභ

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභ/අලාභ හඳුනා ගනු ලබන්නේ එය බැහැර කළ වර්ෂය තුලයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

2.2.23 වියදම් හඳුනා ගැනීම

(අ) අයහාර වියදම්

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දී වියදම් හඳුනා ගනු ලබන්නේ ආදායම් ඉපැයීම සඳහා දැරූ පිරිවැය සහ එය මත සෘජු සම්බන්ධතාවය පදනම් කර ගැනීමෙනි.

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා දරනු ලබන පිරිවැය, ප්‍රාග්ධන නඩත්තු වියදම් ආදිය මෙහෙය වීමේ වියදම්, ආයතනික වියදම් ආදී කටයුතුවල ඵලදායිතාවය ඉහළ නංවමින් ආදායම් ඉපැයීම සඳහා සිදු කළ වියදම් අයහාර වියදම් ලෙස දැක්වේ. වර්ෂ අවසානයේ මෙහි ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට ගනු ලබයි.

(ආ) ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම් දරනු ලබන්නේ වත්කමේ ස්වභාවය වැඩිදියුණු කිරීමටයි. එනම් ඵලදායිතාවය වැඩි කිරීම සඳහා දරන වියදම් වේ. එසේම ව්‍යාපාරය ඉදිරියට පවත්වා ගෙන යාමට හෝ එහි පරිමාණය වර්ධනය කිරීමට සහ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා ප්‍රාග්ධන වියදම් දරනු ලැබේ.

(ඇ) ණය ගැනුම්

ආයතනය ප්‍රධාන ලෙස ණය මුදල් යොදා ඇත්තේ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් වැඩි කර ගැනීමට, ප්‍රතිග්‍රහනය සඳහා සහ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමටය. මෙහි දී ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් යොදා ඇති වටිනාකම / තක්සේරු අගය අදාල වත්කම් කාණ්ඩය යටතේ දක්වා ඇති අතර අනෙකුත් සියළුම ණය ගැණුම් ආදායම් ප්‍රකාශයේ ගලපා දක්වා ඇත. ණය ගැණුම් යටතේ පොළී සහ ණය සම්බන්ධ අනෙකුත් වියදම් ද දක්වා ඇත.

(ඈ) ශුද්ධ මූල්‍යමය ආදායම්/වියදම්

මූල්‍යමය ආදායම් ලෙස බැංකු තැන්පතු ආයෝජන සඳහා පොළිය, සේවක ණය නැවත ගෙවීම් සහ මූල්‍යමය වත්කම් වල සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශයන්හි සටහන් කරනු ලැබේ. පොළී ආදායම් සංචිත පදනම මත සාධනීය පොළී ක්‍රමය මත හඳුනා ගෙන ඇත.

මූල්‍යමය වියදම් ලෙස පොළී වියදම්/ගෙවීම්, මූල්‍යමය වත්කම් සාධාරණ අගය වෙනස් වීම්, (අපහයන අලාභ) සහ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් කෙරෙහි ඉදිකිරීම් ප්‍රතිග්‍රහනයට අයත් නොවන වත්කම් ආදායම් ප්‍රකාශයෙහි සාධනීය පොළී ක්‍රමය යටතේ හඳුනා ගෙන ඇත.

(ඉ) බොල් ණය සඳහා වෙන් කිරීම්

මෙම වෙන් කිරීම හඳුනා ගනු ලබන්නේ වර්තමාන නීතිමය වගකීමක් හෝ අතීතයේ ඇති වූ සමහර ගනුදෙනු පදනම් කර ගනිමිනි. මෙම ගණුදෙනු නිරවුල් කිරීමේ දී මුදල් ප්‍රවාහ ආයතනයෙන් පිටතට ගලායන අතර මේ සඳහා යොදා ගන්නා වූ උපක්‍රමයක් ලෙස ඇස්තමේන්තුවක් ඇති කිරීම සාමාන්‍යයෙන් සිදු කරයි. තනි තනි ශේෂ සියුම් ලෙස පරීක්ෂා කර බොල් ණය වියදම් හඳුනාගත යුතුය. එසේ හඳුනා ගන්නා පිරිවැය ආවරණය කර ගැනීම උදෙසා ආයතනය විසින් ප්‍රමාණාත්මක ඇස්තමේන්තුවක් ඇති කර ගත යුතුයි.

2.2.24 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ආයතනයේ හෝ වෙනත් පරිබාහිර තුන්වන පාර්ශවයක් විසින් කරන්නා වූ ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ආයතනයේ මූල්‍ය ප්‍රතිපත්ති හා තීරණවලට සැලකිය යුතු අන්දමේ බලපෑමක් කල හැකි නම් හා එසේ සිදු වී ඇති නම් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළ යුතුය. අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 22 මගින් හෙලිදරව් කරනු ලබයි.

ආස්ථිත්වයේ සම්බන්ධිත පාර්ශව

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී සම්බන්ධිත ඒකකයන් කිසිවක් නොමැත.

2.2.25 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙම ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය "වක්‍ර ක්‍රමය අනුව" සකස් කර ඇත.

2.2.26 අංශ තොරතුරු

ආයතනය නියැලී සිටින ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ එහි ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළින් උපයන ආදායම, දරන ලද වියදම මෙහෙයුම් අංශ තුළ ඇතුලත් වේ. ආයතනයේ අනෙකුත් අංශවලින් සිදුවන ගණුදෙනු සමඟ මෙහෙයුම් අංශ ආදායම සහ වියදම හඳුනා ගනු ලබයි. අංශවල සම්පත් බෙදා හැරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ කාර්යසාධන තක්සේරු කිරීම සඳහා සියළුම මෙහෙයුම් අංශවල මෙහෙයුම් ප්‍රතිඵල ක්‍රමවත් ලෙස ආයතනයේ කළමණාකාරීත්වය විසින් සමාලෝචනයට ලක් කරනු ලබයි.

මේ සඳහා වෙන් වෙන්ව පවතින මූල්‍ය තොරතුරු ලබාගත හැකිය. මේ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ සටහනක් මගින් හෙලිදරව් කර ඇත.

2.2.27 කොටසක ඉපැයුම්

සාමාන්‍ය කොටසක් වෙනුවෙන් හිමි ලාභාංශ ආයතනයේ වර්ෂය තුළ ඇති බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදූ කල කොටසක ඉපැයුම් ලැබේ.

2.2.28 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ගිණුම් කාල පරිච්ඡේදයේ අවසන් දිනයත් මූල්‍ය ප්‍රකාශන අධිකාරී බලයෙන් යුතුව නිකුත් කරන දිනයන් අතර කාලසීමාවේ දී මූල්‍ය ප්‍රකාශන වලට බලපෑ හැකි සතුටුදායක හෝ අසතුටුදායක සිද්ධි ඇති විය හැකිය. මේවා ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් ලෙස හැඳින්වේ.

මෙම සිද්ධි සලකා බලා මූල්‍ය ප්‍රකාශනවල යම් සංශෝධනයන් අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රමාණාත්මක හෙලිදරව් කිරීමක් හෝ ගැලපීමක් අවශ්‍ය නම් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කල යුතුය. එලෙස සිදුවීම් හට ගෙන නොමැති නම් ඒ අවස්ථාවල දී ගැලපීමක් අවශ්‍ය නොවේ. තවද අදාල කාලය තුළ ආයතනයේ ගැලපිය යුතු හෝ සටහන් විය යුතු මූල්‍ය ප්‍රකාශන වලට බලපෑ කිසිදු හේතුවක් නොවීය.

2.2.29 වගකීම් සහ අවිනිශ්චිත සිදුවීම්

වාර්තාකරණ දිනට පැවති වගකීම් සහ අවිනිශ්චිත සිදුවීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 23 මගින් හෙළිදරව් කරයි.

2.2.30 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ ලෙස සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වූ වගකීම ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

මූල්‍ය ප්‍රකාශන වල හෝ ආයතනයේ වංචා හා වැරදි ඇත්නම් ඒවා සොයා ගෙන ඒවාට පිළියම් යෙදීම, අවශ්‍ය අවස්ථාවල දී නව ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ප්‍රමාණාත්මක ඇස්තමේන්තු ඇති කිරීම, තෝරා ගැනීම, භාවිතය සහ සමාලෝචනය කර අවශ්‍ය විටක සංශෝධනය කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 03 - ආදායම

	2023/2024 රු.	2022/2023 රු.
දළ විකුණුම්	12,136,979,917	9,441,056,400
අඩු කළා : ආපසු එවුම්	(4,950,211)	(24,280,129)
ශුද්ධ විකුණුම් (සටහන 03.01)	**12,132,029,706**	**9,416,776,271**

සටහන 03.01 - වෙළඳ අංශ (ශුද්ධ විකුණුම්)

	2023/2024 රු.	2022/2023 රු.
රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	678,199,226	989,466,830
තො.ස.තා. නිපැයුම්	660,086,111	358,777,332
කාර්යාල සැපයුම්	393,593,416	372,467,640
රථ වාහන ටයර් අංශය	229,435,930	242,593,285
තීරු බදු නිදහස් ප්‍රදර්ශනාගාරය	11,575,579	19,268,522
විදුලි සහ විද්‍යුත් උපකරණ	2,307,097,373	213,499,779
විශේෂ ව්‍යාපෘති ඒකකය	103,543,497	105,450,290
ගෘහස්ථ උපකරණ හා මෙවලම්	167,150,581	400,374,661
ඉදිකිරීම්, ලෝහ උපකරණ හා මෙවලම්	175,294,346	268,200,300
අත්‍යවශ්‍ය ආහාර, කෘෂි උපකරණ හා යාන්ත්‍රික උපකරණ	7,302,373,880	6,378,694,690
ස්වශක්ති	103,679,769	67,982,942
	12,132,029,706	**9,416,776,271**

සටහන 03.02 - අංශ ගත මෙහෙයුම් ප්‍රතිඵල (දළ ලාභ)

	2023/2024 රු.	2022/2023 රු.
රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	256,076,265	336,774,106
තො.ස.තා. නිපැයුම්	77,400,522	24,780,251
කාර්යාල සැපයුම්	72,604,137	110,702,911
රථ වාහන ටයර් අංශය	36,052,117	32,367,653
තීරු බදු නිදහස් ප්‍රදර්ශනාගාරය	4,062,009	6,009,146
විදුලි සහ විද්‍යුත් උපකරණ	417,224,615	32,480,523
විශේෂ ව්‍යාපෘති ඒකකය	18,048,362	17,868,546
ගෘහස්ථ උපකරණ හා මෙවලම්	25,508,804	64,927,777
ඉදිකිරීම්, ලෝහ උපකරණ හා මෙවලම්	22,639,130	31,077,606
අත්‍යවශ්‍ය ආහාර, කෘෂි උපකරණ හා යාන්ත්‍රික උපකරණ	1,015,679,940	349,158,110
ස්වශක්ති	21,916,044	13,112,918
	1,967,211,946	**1,019,259,548**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 04 - අනෙකුත් මෙහෙයුම් ආදායම්

	2023/2024 රු.	2022/2023 රු.
විනිමය මත ලාභ (අලාභ) DFS	(1,914)	(22,478)
විවිධ ආදායම් (සටහන 04.01)	904,881	46,298
රජවාස ආහාර උළෙල	141,000	-
ශ්‍රී.ල. යුද්ධ හමුදාව - කොමිස් ආදායම	18,114,887	-
ස්ථාවර වත්කම් විකිණීම මත ලාභය	-	100,000
වෙළඳ තොගයට වත්කම් පැවැරුම මත ලාභය	-	2,252,197
කුලී ආදායම - Q Shop	3,706,209	-
කුලී ආදායම - රජවාස	12,810,202	12,221,436
කුලී ආදායම - රාජගිරිය පරිශ්‍රය	21,600,000	20,700,000
	57,275,265	**35,297,453**

(සටහන 04.01) - විවිධ ආදායම

	2023/2024 රු.	2022/2023 රු.
හානි වූ අයිතම විකිණීම	904,881	-
වෙනත්	-	46,298
	904,881	**46,298**

සටහන 05 - බෙදාහැරීමේ වියදම්

	2023/2024 රු.	2022/2023 රු.
සාම්පල් වියදම්	2,550,565	651,731
ටෙන්ඩර් පත්‍රිකා	1,160,631	479,230
සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමේ වියදම්	1,124,651	1,702,665
ගඩඩා සහ ප්‍රදර්ශනාගාර කුලිය	38,265,799	41,331,197
ලොරි රථ කුලී/ප්‍රවාහන	3,796,783	8,293,605
සේවාකිරිම් ගාස්තු	831,875	1,001,015
විකුණුම් නියෝජිත කොමිස්	20,630,263	22,330,788
ණය එකතු කිරීම වෙනුවෙන් කොමිස්	342,716	298,051
වෙළඳ ප්‍රදර්ශන වියදම්	1,513,730	-
බලපත්‍ර ගාස්තු- විකිණීම	311,404	89,486
ටෙලෙක්ස්/ ෆැක්ස් / විද්‍යුත් තැපැල්	9,328	-
විදේශ ගමන්	1,717,908	833,995
වෙළඳ ප්‍රවර්ධන වියදම්	3,283,850	424,114
දැන්වීම් ප්‍රචාරණය	1,955,116	1,035,463
භාණ්ඩ පැටවුම් සහ බෑම් වියදම්	856,000	272,000
අය කළ නොහැකි එකතු කළ අගය මත බදු	233,466	-
සහල් ආනයන / අපනයන වියදම්	-	50,139,315
තොග/ අනිකුත් හිඟයන් කපා හරින ලද ගිණුම	251,739	-
ණයගැතියන්/ තොග සහ අනිකුත් කපාහරින ලද ගිණුම	643,075	-
ආයතනික ගණුදෙනුකරුවන්ගේ විකුණුම් ප්‍රවර්ධනය	41,919	-
බිත්තර ආනයන වියදම්	-	44,090
සමාජ ආරක්ෂණ දායකත්ව බදු වියදම්	86,942,743	15,560,598
තොග හානි අලාභ	(13,831,834)	(16,441,863)
ණයගැතියන්ගේ හානි අලාභ	68,461,383	105,281,937
	221,093,107	**233,327,415**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 06 - පරිපාලන වියදම්

	2023/2024 රු.	2022/2023 රු.
වැටුප්	143,993,622	153,859,687
සේ.අ.අ.	21,012,654	23,658,608
සේ.භා.අ.	4,202,532	4,734,438
අතිකාල සහ විශේෂ දීමනා	21,407,791	25,309,490
අළුත් අවුරුදු උත්සව අත්තිකාරම්	41,679,289	6,430,000
කොන්ත්‍රාත් සහ අනියම් සේවක වැටුප්	32,671,896	45,134,944
කාර්යමණ්ඩල ප්‍රතිලාභ පිරිවැය	1,522,167	1,006,898
කාර්යමණ්ඩල සුබසාධනය	4,637,000	2,687,961
කාර්යමණ්ඩල වෛද්‍ය වියදම්	3,846,978	3,273,992
කාර්යමණ්ඩල වාහන සහ ඉන්ධන, ප්‍රවාහන, වෘත්තීය හා අනෙකුත් දීමනා	10,026,358	9,871,055
නිල ඇඳුම්	609,527	1,111,041
ශ්‍රම වියදම්	26,500	15,900
මරණ පාරිතෝෂිකය	700,000	200,000
ලබා නොගත් නිවාඩු සඳහා මුදල්	7,979,687	8,083,390
පාරිතෝෂික ප්‍රතිපාදනය	11,918,676	6,623,591
ගමන් සහ යැපීම් දීමනා	4,889,369	4,757,801
විගණන ගාස්තු	1,482,000	1,326,000
වෘත්තීමය සහ උපදේශන සේවා ගාස්තු	621,298	100,000
නෛතික ගාස්තු	2,936,358	187,042
ලේකම් කටයුතු සහ අනෙකුත් වියදම්	9,004,184	1,882,119
අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්	880,000	954,665
අධ්‍යක්ෂවරුන්ගේ දීමනා	1,210,000	848,000
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම්	124,128	88,868
රක්ෂණ- සාමාන්‍ය	1,038,514	3,351,926
වරිපනම් සහ බදු	3,958,100	5,012,285
බලපත්‍ර ගාස්තු	2,159,234	1,225,318
දුරකථන ගාස්තු	9,828,095	10,071,789
විදුලි ගාස්තු	31,833,428	21,047,835
තැපැල් ගාස්තු	2,592,483	849,939
ජල ගාස්තු	3,089,868	2,538,332
පුවත්පත් සහ වාර ප්‍රකාශන	473,913	171,090
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	8,087,277	7,132,768
නඩත්තුව - ගොඩනැගිලි	10,237,927	6,611,701
නඩත්තුව - කාර්යාල උපකරණ	14,490,884	9,741,019
නඩත්තුව - ගබඩා උපකරණ	2,710,947	5,803,930
නඩත්තුව - ප්‍රදර්ශනාගාර	5,598,914	6,326,311
නඩත්තු සහ අනෙකුත් වියදම් - රජවාස	13,373,192	5,842,130
නඩත්තු සහ අනෙකුත් වියදම් - Q-Shop	3,182,870	1,978,341
නඩත්තුව - රථ වාහන	9,137,248	9,076,889
මෝටර් රථ වාහන ලියාපදිංචිය සහ රක්ෂණය	139,955	150,082
ඉන්ධන සහ ලිහිසි තෙල්	8,332,168	7,932,222
පරිගණක කළමනාකරණ ගාස්තු	1,163,520	1,022,323
පරිගණක නඩත්තුව	-	1,596,730
ක්ෂය කිරීම් - රථ වාහන	20,908,276	-
ක්ෂය කිරීම් - පිරියත හා උපකරණ	3,864,543	3,927,450
ක්ෂය කිරීම් - කාර්යාල උපකරණ හා පරිගණක	3,204,043	2,677,353
ක්ෂය කිරීම් - ලී බඩු	5,634,630	6,016,600
ක්ෂය කිරීම් - මෙවලම් හා උපකරණ	410,150	371,964
ක්ෂය කිරීම් - ප්‍රදර්ශනාගාර උපකරණ	2,182,007	2,182,007
ක්ෂය කිරීම් - පරිගණක මෘදුකාංග	3,110,000	-
බදුකරයට ලබාගත් පරිශ්‍රයන් මත ඉදිකළ කාර්යාල/ප්‍රදර්ශනාගාර ක්ෂයවීම, රජවාස ව්‍යාපෘතිය ඉදිකිරීම	8,069,254	8,069,254
කාර්යමණ්ඩල සංවර්ධන සහ පුහුණු වියදම්	1,344,807	584,108
	507,538,260	**433,457,185**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 07 - ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)

	2023/2024 රු.	2022/2023 රු.
පොළී ආදායම		
කෙටිකාලීන තැන්පතු මත පොළී ආදායම	269,485,510	368,285,283
කාර්ය මණ්ඩල ණය මත පොළිය	1,181,432	1,169,056
පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ප්‍රතිවර්තනය	1,522,167	1,006,898
	272,189,109	**370,461,238**
මූල්‍ය වියදම		
ඇයිරා පොළිය	10,515,616	6,092,289
කෙටිකාලීන භාර ණය පොළිය	49,514,678	8,212,041
බැංකු ගාස්තු	6,799,711	8,493,365
	66,830,005	**22,797,696**
	205,359,103	**347,663,542**

සටහන 08 - ආදායම් බදු වියදම

	සටහන්	2023/2024 රු.	2022/2023 රු.
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බද්ද - 2023/2024	08.01	470,884,734	-
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බද්ද - 2022/2023		(6,624,272)	-
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බද්ද - 2022/2023		-	222,987,787
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බද්ද - 2021/2022		-	433,506
තක්සේරු කිරීම් සඳහා ගෙවනු ලැබූ ආදායම් බද්ද		-	2,351,622
විලම්බිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය)	08.02	70,785,831	(26,101,761)
		535,046,293	**199,671,154**

(සටහන 8.1) ගිණුම්ගත ලාභය සහ ආදායම් බද්ද අතර සැසඳුම

මාර්තු 31න් අවසන් වසර සඳහා	2023 / 2024 රු.	2022 / 2023 රු.
බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය	1,501,214,947	735,435,943
ආයෝජන ආදායම	(269,485,510)	(368,285,283)
නොඉඩදුන් අයිතම එකතුව	115,759,408	110,739,039
ඉඩදුන් අයිතම එකතුව	(47,358,577)	(31,742,224)
ගලපන ලද ව්‍යාපාරික ලාභය	**1,300,130,268**	**446,147,475**
ආයෝජන ආදායම	269,485,510	368,285,283
බදු අය කළ හැකි ආදායම	**1,569,615,778**	**814,432,758**
30% බැගින් වර්ෂය සඳහා ලාභ මත ආදායම් බද්ද	**470,884,734**	**222,987,787**

(සටහන 8.2) විලම්භිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය)

විලම්බිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය) පැන නැගුණේ :	2023 / 2024 රු.	2022 / 2023 රු.
විලම්භිත බදු වත්කම් සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	73,330,854	(26,509,551)
විලම්භිත බදු වගකීම් සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	(1,860,757)	(873,534)
ආයුගණක අලාභ සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	(684,266)	1,281,324
	70,785,831	**(26,101,761)**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 09 - කොටසක් සඳහා ඉපැයුම්

කොටසක් සඳහා මූලික ඉපැයුම්

කොටසක් සඳහා මූලික ඉපැයුම් ගණනය කරනු ලබන්නේ කොටස් හිමියන්ට ආරෝපණීය ශුද්ධ ලාභය වසර තුළ නිකුත් කළ සාමාන්‍ය කොටස්වල භරිත සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීම මගිනි.

	2023/2024 රු.	2022/2023 රු.
කොටස් හිමියන්ට ආරෝපණීය ශුද්ධ ලාභය (රු. ශත)	966,168,654	535,764,789
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස්වල භරිත සාමාන්‍ය සංඛ්‍යාව	10,000,000	10,000,000
කොටසක් සඳහා මූලික ඉපැයුම්/(අලාභ) රු. ශත	**97**	**54**

කොටසක් සඳහා තනුක ඉපැයුම්

2024 මාර්තු 31න් අවසන් වූ වසර තුළ කිසිදු අවස්ථාවක නොපිය වූ තනුක භව්‍ය සාමාන්‍ය කොටස් නොතිබුණි. එබැවින් කොටසක් සඳහා තනුක ඉපැයුම් ඉහත වාර්තා කරන ලද කොටසක් සඳහා මූලික ඉපැයුම්වලට සමාන වේ.

සටහන 10 - දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය /ප්‍රත්‍යාගණනය	ඉඩම් රු.	ගොඩනැගිලි රු.	බදු පදනම් මත ලබාගෙන ඇති ගොඩනැගිලි රු.	ප්‍රදර්ශණාගාර උපකරණ රු.	මෝටර් රථ වාහන රු.	කාර්යාල උපකරණ රු.	පරිගණක රු.	මෙවලම් සහ උපකරණ රු.	ගෘහ භාණ්ඩ හා සවිකිරීම් රු.	එකතුව රු.
2023 අප්‍රේල් 01 දිනට	226,240,000	52,123,790	365,001,278	38,308,984	104,370,000	46,498,023	53,311,892	4,604,753	76,650,751	967,109,470
වසර තුළ ප්‍රත්‍යාගණන ගැලපීම්	3,416,360,000	107,568,460	-	-	-	(29,658,333)	(34,660,251)	(3,688,772)	(44,316,387)	3,411,604,717
එකතුකිරීම්	-	-	-	-	-	402,710	7,077,789	263,019	2,778,437	10,521,955
2024 මාර්තු 31 දිනට ශේෂය	**3,642,600,000**	**159,692,250**	**365,001,278**	**38,308,984**	**104,370,000**	**17,242,400**	**25,729,430**	**1,179,000**	**35,112,801**	**4,389,236,142**
ක්ෂයවීම/හානිවීම										
2023 අප්‍රේල් 01 දිනට	-	52,123,787	194,941,634	15,253,086	-	26,674,231	49,505,520	2,706,206	59,293,658	400,498,122
ප්‍රත්‍යාගණන ගිණුමට මාරු කළ සමුච්චිත ක්ෂය 2023/2024	-	(52,123,787)	-	-	-	(30,538,775)	(52,709,563)	(3,116,356)	(64,928,289)	(203,416,770)
වසර සඳහා ක්ෂය ගාස්තුව	-	-	26,738,315	7,950,628	20,908,276	3,864,543	3,204,043	410,150	5,634,630	68,710,585
2024 මාර්තු 31 දිනට ශේෂය	**-**	**0**	**221,679,949**	**23,203,714**	**20,908,276**	**(1)**	**0**	**(0)**	**(1)**	**265,791,937**
2023 අප්‍රේල් 01 දිනට වටිනාකම රැගෙන යාම	226,240,000	3	170,059,644	23,055,898	104,370,000	19,823,793	3,806,372	1,898,547	17,357,092	566,611,347
2024 මාර්තු 31 දිනට ශේෂය	**3,642,600,000**	**159,692,250**	**143,321,328**	**15,105,270**	**83,461,724**	**17,242,402**	**25,729,430**	**1,179,000**	**35,112,801**	**4,123,444,205**

සටහන 10අ - අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය /ප්‍රත්‍යාගණනය	පරිගණක මෘදුකාංග රු.	එකතුව රු.
2023 අප්‍රේල් 01 දිනට ශේෂය	9,330,000	9,330,000
එකතු කිරීම්	1,805,000	1,805,000
2024 මාර්තු 31 දිනට ශේෂය	**11,135,000**	**11,135,000**
ක්ෂයවීම/හානිවීම		
2023 අප්‍රේල් 01 දිනට ශේෂය	-	-
වසර සඳහා ක්ෂය	3,110,000	3,110,000
2024 මාර්තු 31 දිනට ශේෂය	**3,110,000**	**3,110,000**
2023 අප්‍රේල් 01 දිනට වටිනාකම රැගෙන යාම	9,330,000	9,330,000
2024 මාර්තු 31 දිනට වටිනාකම රැගෙන යාම	**8,025,000**	**8,025,000**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 11 - කොටස්වල ආයෝජන

	2023/2024 රු.	2022/2023 රු.
එස් ටී සී මෙඩිකල් ලිමිටඩ්	49,990	49,990
අඩු කළා : එස් ටී සී මෙඩිකල් ලිමිටඩ් කොටස්වල ආයෝජනයේ අගය කපා හැරීම	(49,990)	(49,990)
	-	-
ලංකා නැව් සමාගම	20	20
	20	**20**

සටහන 12 අ - කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය

	සටහන්	2023/2024 රු.	2022/2023 රු.
ජංගම නොවන			
කාර්ය මණ්ඩල ණය	12.1	15,896,876	13,833,661
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	12.2	1,735,207	1,589,005
		17,632,082	**15,422,666**
ජංගම			
කාර්ය මණ්ඩල ණය	12.1	6,203,438	5,863,185
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	12.2	1,320,449	1,128,269
		7,523,887	**6,991,454**
		25,155,969	**22,414,120**

සටහන 12.1 - කාර්ය මණ්ඩල ණය

	2023/2024	2022/2023
වර්ෂය ආරම්භයේ දී ශේෂය	22,414,121	17,847,495
වර්ෂය තුල ප්‍රදානය කළ ණය	12,624,000	13,916,500
ආපසු අය කර ගත් ණය	(9,882,152)	(9,349,874)
	25,155,969	**22,414,121**
පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ වෙත පැවැරුම්	(3,055,655)	(2,717,272)
වසර අවසානයේ දී ශේෂය	**22,100,314**	**19,696,849**
ජංගම නොවන	15,896,876	13,833,661
ජංගම	6,203,438	5,863,185
	22,100,314	**19,696,846**

සටහන 12.2 - පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

	2023/2024	2022/2023
වසර ආරම්භයේ දී ශේෂය	2,719,483	1,490,942
වසර තුළ එකතු කිරීම්	1,858,339	2,237,662
ක්‍රමක්ෂය	(1,522,167)	(1,009,121)
වසර අවසානයේ දී ශේෂය	**3,055,655**	**2,719,483**
ජංගම නොවන	1,735,207	1,589,005
ජංගම	1,320,449	1,128,269
	3,055,655	**2,717,274**

සමාගම සහනදායී අනුපාත යටතේ සේවකයන්ට ණය ලබා දෙයි. ඒ හා සමාන ණය සඳහා වෙළඳපොළ ආශ්‍රිත අනුපාත භාවිත කරමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම මඟින් සේවක ණයවල සාධාරණ වටිනාකම නිර්ණය කරනු ලැබේ. සේවක ණයවල පිරිවැය සහ සාධාරණ වටිනාකම අතර වෙනස්කම් හඳුනා ගනු ලබනුයේ පෙර ගෙවූ කාර්යමණ්ඩල ප්‍රතිලාභ ලෙසය. මෙම ණය ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබීය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 13 - තොග

	2023/2024 රු.	2022/2023 රු.
අවසන් තොගය	685,725,364	529,846,415
මාර්ගස්ථ භාණ්ඩ	406,403,359	953,673,309
හානි වූ සහ සෙමෙන් අළෙවි වන තොග සඳහා ප්‍රතිපාදනය	(2,436,556)	(16,330,350)
	1,089,692,167	**1,467,189,374**

සටහන 14 - වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

	2023/2024 රු.	2022/2023 රු.
වෙළඳ ණයගැතියෝ	822,322,109	721,229,500
ණයගැති හානි සඳහා අඩුකිරීම්	(184,147,087)	(115,685,704)
	638,175,022	**605,543,796**
වෙනත් ලැබීම්	5,400,000	13,902,500
උත්සව අත්තිකාරම්	2,321,611	2,346,750
විදුලිය සඳහා තැන්පතු	1,192,000	879,500
ආරක්ෂිත තැන්පතු - ජා.ඉ. බැංකුව	1,088,453	1,069,845
බහාලුම් තැන්පතු	7,471,000	45,000
කුලී මුදල් තැන්පතු	18,237,962	21,428,789
විවිධ තැන්පතු	906,500	906,500
වරාය අධිකාරිය - PVQ	50,000	50,000
ලංසු බැඳුම්කර ගිණුම	8,380	21,380
පෙර ගෙවුම්	-	113,727,210
සුළු මුදල්වලින් කාර්යමණ්ඩල අත්තිකාරම්	44,500	48,500
ඇපකර - මහජන බැංකුව	600,000	600,000
ලැබිය යුතු ඒකක තුල අගය මත බදු	152,917,121	-
ලැබිය යුතු පොළිය	131,354,807	232,708,493
ලැබිය යුතු රැඳවුම් බද්ද	46,413	46,413
අධ්‍යාපන දෙපාර්තමේන්තුව	7,784,039	7,784,039
විවිධ වියදම් අත්තිකාරම්	905,053	1,111,953
සේවා සඳහා අත්තිකාරම්	-	203,195
අනෙකුත් ගෙවිය යුතු දෑ මත අත්තිකාරම	4,517,081	4,517,081
Q-Shop සඳහා අත්තිකාරම්	33,080	34,260
බදු කුලී අත්තිකාරම් ගෙවීම - පළමු වසර	62,500	212,500
ආරක්ෂිත තැන්පතු - Q Shop	191,128	191,128
ලැබිය යුතු පොලී ගිණුම මත රඳවාගැනීමේ බදු	6,913,411	-
නැව්ගාස්තු ඇප සහතික ආන්තිකය - මහජන බැංකුව	52,511,747	-
නැව්ගාස්තු ඇප සහතික ආන්තිකය - සම්පත් බැංකුව	42,471,000	14,946,000
කාර්යමණ්ඩල ණයගැතියෝ - වැටුප් අත්තිකාරම	46,250	46,250
අයකරගත යුතු තොග ඌනතා ගිණුම - Q වෙළඳහල්	-	185,397
ඩේවිඩ් පීරිස් මෝටර් රථ සමාගම	1,074,440	1,074,440
අබලි බැටරි පාලන ගිණුම	-	299,923
සයන්ටර් ටෙක්නොලොජීස් (පුද්.) සමාගම	-	1,805,000
අධ්‍යාපන අමාත්‍යාංශය - නව	822,919,071	-
කුලී තැන්පතු - ස්පෙක්ට්‍රා ඉන්ටර්ග්‍රේටඩ් ලොජිස්ටික්	7,000,000	-
ණය/ කුලීපිට ගැනුම්, කුලී, රක්ෂණ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	4,685,217	4,688,217
නාම පුවරුව සඳහා අයකර ගැනීම් - රජවාස	153,000	153,000
	1,911,080,785	**1,030,577,057**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 15 - අතැති මුදල් සහ මුදලට සමාන දෑ

	2023/2024 රු.	2022/2023 රු.
බැංකුවේ ඇති මුදල්		
ලංකා බැංකුව (ගි.අ. 8859546)	270,158	270,158
සම්පත් බැංකුව (ගි.අ. 0009300000337)	1,218,404	1,354,218
සම්පත් බැංකුව - තීරු බදු රහිත සාප්පුව (ගි/අ. 002930006974)	508,313	131,660
ලංකා බැංකුව (ගි.අ. නඳ 1060)	681,790	93,358
ජා.ස.බැංකුව (ගි.අ. - 101000160408)	235,845	478,506
මහජන බැංකුව - කුරුණෑගල	1,011,200	1,015,315
මහජන බැංකුව - මහනුවර	1,824,267	1,312,850
මහජන බැංකුව - මාතර	2,425,851	1,006,750
මහජන බැංකුව - කල්මුණේ	3,110,331	1,000,000
මහජන බැංකුව - සහල් 004 1001 8 0206579	377,929	614,901
මහජන බැංකුව - සහල් 004 1002 7 0206579	51,951	81,951
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	26,204	25,474
සුළු මුදල් අග්‍රිමය	643,586	873,019
අතැති මුදල්	56,780,985	5,216,191
	69,166,814	**13,474,352**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 16 - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

	2023 / 2024 රු.	2022 / 2023 රු.
වසර ආරම්භයේ දී ශේෂය	34,243,718	39,164,924
වසර තුළ වෙන් කළ ප්‍රතිපාදනය	14,199,562	10,894,671
වසර තුළ සිදු කළ ගෙවීම්	(7,997,040)	(15,815,878)
වසර අවසානයේ දී ශේෂය	**40,446,241**	**34,243,718**

ප්‍රතිලාභ ගණනය කිරීම පිණිස කළමනාකාරිත්වය විසින් යොදා ගනු ලැබ ඇති තක්සේරු ක්‍රමය වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 'කාර්ය මණ්ඩල ප්‍රතිලාභ'

වසර මුළුල්ලෙහි විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ සංචලනය පහත පරිදි වේ.	2023 / 2024 රු.	2022 / 2023 රු.
පොළී වියදම	3,834,731	4,660,438
වත්මන් සේවා වියදම	8,083,945	1,963,154
කාර්ය මණ්ඩල පිරිවැයේ ඇතුලත් කර ඇති මුළු ප්‍රමාණය	**11,918,676**	**6,623,591**
හඳුනා ගත් සත්‍ය ශුද්ධ ලාභ/අලාභ	2,280,886	4,271,080
හඳුනා ගත් මුළු විස්තීරණ ආදායම	**14,199,562**	**10,894,671**

කළමනාකාරිත්වය විසින් භාවිත කරනු ලැබූ ප්‍රධාන උපකල්පනයන්ට පහත දෑ අන්තර්ගත වේ.

මූල්‍ය උපකල්පන	31.03.2024	31.03.2023
වාර්ෂික පොළී අනුපාතය	12%	12%
වැටුප් වැඩි වීමේ අනුපාතය	2%	1%
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය	16%	13%
විශ්‍රාම යාමේ වයස (අවුරුදු)	60	60

සමාගම ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවතිනු ඇත.

සටහන 17 - ශුද්ධ විලම්භිත බදු වගකීම (වත්කම)

	2023 / 2024 රු.	2022 / 2023 රු.
වසර ආරම්භයේ දී ශේෂය	(41,032,830)	(13,649,744)
වසර සඳහා ප්‍රතිපාදනය/ප්‍රතිවර්තනය	71,470,097	(27,383,085)
වසර අවසානයේ ශේෂය	**30,437,267**	**(41,032,830)**

විලම්භිත බදු ගණනය කරනු ලබන්නේ ස්ථාවර වත්කම්වල ධාරණ වටිනාකම සහ බදු අය කළ හැකි එක් එක් ක්‍රියාකාරකම මගින් විශ්ලේෂණය කළ පරිදි එවැනි වත්කම්වල බදු ලියා හළ අගය අතර තාවකාලික වෙනස්කම් ලෙසය.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම් ආශ්‍රිත කාල වෙනස්කම්වලින් පැන නගින බදු බලපෑමේ සැසඳුම පහත පරිදිය.

	2023 / 2024 රු.	2022 / 2023 රු.
සෙමින් අළෙවි වන තොග සඳහා ප්‍රතිපාදනය	89,701,131	3,150,405
බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය	4,168,138	(32,209,184)
සේවක ප්‍රතිලාභ වගකීම	(20,538,415)	(873,534)
බදු කාර්යයන් සඳහා ත්වරිත ක්ෂය	(1,860,757)	2,549,227
	71,470,097	**(27,383,086)**

සටහන 18 - කෙටිකාලීන ණය ගැනුම්

	2023 / 2024 රු.	2022 / 2023 රු.
ජංගම වගකීම්		
කෙටිකාලීන		
කාලීන ණය - මහජන බැංකුව	45,200,000	
කාලීන ණය - ලංකා බැංකුව	552,872,266	
කාලීන ණය - සම්පත් බැංකුව	193,567,000	13,600,000
මුළු ණය වගකීම	**791,639,266**	**13,600,000**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 19 - වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

	2023/2024 රු.	2022/2023 රු.
වෙළඳ ණයහිමියෝ	361,444,482	290,036,187
විදේශ ආනයන වගකීම	126,391,314	1,580,420,481
උපචිත වියදම්	68,274,950	52,040,751
ගෙවිය යුතු චකතු කළ අගය මත බදු	-	2,909,027
ගෙවිය යුතු ආදායම් බදු	431,064,211	221,332,030
ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	10,067,039	-
අනෙකුත් ණයහිමියෝ - විවිධ	2,930,495	1,887,719
විගණන ගාස්තු	1,482,000	2,652,000
ආරක්ෂිත තැන්පතුව - ජා. ඉ. බැංකුව	1,088,453	1,069,845
සේ. අ. අ.	3,099,704	3,004,700
සේ. භා. අ.	371,965	360,564
කාර්ය මණ්ඩල ණයහිමියෝ - නැවත බැංකු ගත කළ වැටුප් ආදිය	1,291,875	714,355
වැටුප් අඩු කිරීම්	477,678	366,178
වැටුප් අඩු කිරීම් - කාර්ය මණ්ඩලය සහ අනෙකුත්	12,083	5,504
ඒබීසී ට්‍රේඩ් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්	1,041,629	1,041,629
සාලා එන්ටප්‍රයිසස්	93,634	94,507
අබාන්ස් (පුද්) සමාගම	1,920,661	1,920,661
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	285,000	285,000
ගෙවිය යුතු රඳවාගැනීමේ බදු	18,333	27,500
එටිසලාට් ණය කාඩ්පත්	748,683	748,683
නොමිලේ නිකුත් කරන භාණ්ඩ පාලන ගිණුම	109,584	109,584
මුද්දර ගාස්තු වියදම් අය කර ගැනීම	21,875	24,975
ණය/කුලී පිට ගැනුම් අත්තිකාරම	1,191,883	1,191,883
කල්බදු උපකරණ සඳහා ණයහිමියෝ	118,310	118,310
ලැබිය යුතු මුදල් - වර්ෂ අවසාන වෙළඳ ප්‍රවර්ධන වියදම්	-	1,641,069
ලැබිය යුතු මුදල් - යාපනය ප්‍රදර්ශනාගාරය	415,128	415,128
ණය/කුලී පිට ගැනුම් සඳහා ගෙවිය යුතු රක්ෂණය	49,232	49,232
ස්ටැෆඩ් මෝටර් (පුද්) සමාගම	28,000	28,000
රඳවා ගැනීම	3,880,091	4,213,981
සේවා කොන්ත්‍රාත් මත රඳවා ගැනීම	142,389	2,590,392
ආදායම අහිමි වීම පියවීමේ ගිණුම - යාපනය ප්‍රදර්ශනාගාරය	238,765	238,765
සංවර්ධන නිලධාරී සඳහා වැටුප් ප්‍රතිපූර්ණය - වෙළඳ අමාත්‍යාංශය	-	642,394
සහල් ආනයනය සඳහා කාරක ප්‍රාග්ධනය	50,000,000	200,000,000
මහපොළ වෙළඳ පොළ අරමුදල	730,000	-
නව පාරිභෝගිකයින්ගෙන් අත්තිකාරම් ලැබීම	25,491,248	382,400,423
ආපසු ගෙවියයුතු කුලී තැන්පතු	1,455,000	-
ආපසු ගෙවියයුතු ආරක්ෂක තැන්පතු - රජවාස	292,167	-
ආපසු නොගෙවියයුතු ආරක්ෂක තැන්පතු - රජවාස	7,598,173	11,025,956
	1,103,866,032	**2,765,607,414**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 20 - බැංකු අයිරා

	රු.	රු.
මහජන බැංකුව (ගිණුම් අංකය 004100120210918)	350,871,279	105,939,957
	350,871,279	**105,939,957**

සටහන 21 - රජයේ ප්‍රදානය විලම්භීත ආදායම් ගිණුම

	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-1 රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-2 (රජවාස) රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-4 (Q Shop ඉදිකිරීම් වියදම්) රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-5 (රජවාස මඩකලපුව) රු.	එකතුව රු.
වසර ආරම්භයේදී ශේෂය	31,840,235	77,160,316	16,849,024	18,339,927	144,189,502
එකතුව	**31,840,235**	**77,160,316**	**16,849,024**	**18,339,927**	**144,189,502**
ලාභ/අලාභ ගිණුමට අයකලා 2023/2024	6,368,047	7,716,032	5,768,621	4,584,982	24,437,682
වසර අවසානයේදී ශේෂය	**25,472,188**	**69,444,285**	**11,080,402**	**13,754,945**	**119,751,820**

සටහන 22 - සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු

අ) ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 -'සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම' ප්‍රකාරව, ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු අස්තිත්වයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මග පෙන්වීම සහ පාලනය කිරීම සඳහා අධිකාරිය සහ වගකීම ඇති අය වේ. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළුව), අධ්‍යක්ෂ මණ්ඩලයට ආසන්නම පහළ මට්ටමේ සිටින සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සංස්ථාවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර තිබේ.

(i) අධ්‍යක්ෂවරුන් සඳහා ණය

සමාගමේ අධ්‍යක්ෂවරුන්ට කිසිදු ණයක් ප්‍රදානය කොට නොමැත.

(ii) ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග වෙනත් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන 22(**අ**)හි හෙළිදරව් කර ඇති ගනුදෙනු හැර ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

සටහන 23 - ප්‍රාග්ධන වගකීම්

2024 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ගිවිසුම්කර ප්‍රාග්ධන වියදම් සහ අවිනිශ්චිතතාවයන් නොතිබුණි.

සටහන 24 - සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනය පහසු කිරීම පිණිස, පෙර වර්ෂය හා සම්බන්ධ අදාළ ශේෂ ප්‍රවර්තන වසරේ වර්ගීකරණයට අනුකූල වන සේ නැවත වර්ගීකරණය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

සටහන 25 - මූල්‍ය අවදානම් කළමනාකරණය

දළ විශ්ලේෂණය

මූල්‍ය උපකරණ භාවිතයෙන් පහත දැක්වෙන අවදානම්වලට සංස්ථාව නිරාවරණය වේ.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම
- වෙළඳපොළ අවදානම (ව්‍යවහාර මුදල් අවදානම සහ පොළී අනුපතා අවදානම ඇතුළුව)

ඉහත එක් එක් අවදානම වෙත සංස්ථාවේ නිරාවරණය පිළිබඳ ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සහ අවදානම මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා සංස්ථාවේ අරමුණු, ප්‍රතිපත්ති සහ පටිපාටි මෙම සටහන ඉදිරිපත් කරයි.

අවදානම් කළමනාකරණ රාමුව

සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සංස්ථාවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපනය කරනු ලබනුයේ සංස්ථාව විසින් මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීමටත්, උචිත අවදානම් සීමා සහ පාලන පැන වීමටත් අවදානම් සහ සීමාවන්ට අනුගත වීම අධීක්ෂණය කිරීමටත්ය. වෙළඳපොළ තත්ත්වයන් සහ සමාගමේ ක්‍රියාකාරකම් පිළිඹිබු කිරීම පිණිස අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

ණය අවදානම

ණය අවදානම යනු පාරිභෝගිකයකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රතිපාර්ශවය සිය ගිවිසුම්කර බැඳීම් සපුරාලීමට අපොහොසත් වුවහොත් සිදුවන මූල්‍ය අලාභය වන අතර එය මූලික වශයෙන් පැන නගිනුයේ පාරිභෝගිකයින්ගෙන් සහ ආයෝජන සුරැකුම්පත්වලින් සංස්ථාවට ලැබිය යුතු දෑවලිනි.

සමාගම අනුමත ණය ප්‍රතිපත්තියක්අ නුගමනය කරන අතර අවදානම අවම කිරීම සඳහා ගනුදෙනුකරුවන්ට ලැබිය යුතු දේ සමීපව නිරීක්ෂණය කරයි.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීම මගින් පියවනු ලබන තම මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් සපුරාලීමේ දී සංස්ථාව මුහුණ දෙන අවදානම වේ. මෙම අවදානම කළමනාකරණය කිරීමේ දී සංස්ථාවේ ප්‍රවේශය වනුයේ, පිළිගත නොහැකි අලාභ හෝ සංස්ථාවේ කීර්තිනාමයට සිදුවන හානිවලින් තොරව, ගෙවිය යුතු අවස්ථාව වන විට තම වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් තමන් සතුව සැම විටම පවතින බව හැකිතාක් දුරට සහතික කිරීමයි.

ද්‍රවශීලතා අවදානම මැනීම සහ අවම කිරීම පිණිස සංස්ථාව තම ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමීපව අධීක්ෂණය කර, මුදල් හා මුදල් සමාන දෑ ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගත් අතර මූල්‍ය ආයතනවලින් එකඟ වූ අරමුදල් පහසුකම් ලබා ගන්නා ලදී.

වෙළඳපොළ අවදානම

වෙළඳපොළ අවදානම යනු විදේශ විනිමය අනුපාත, පොළී අනුපාත ආදිය වැනි වෙළඳපොළ මිල වෙනස්වීම්, සංස්ථාවේ ආදායම හෝ මූල්‍ය උපකරණවල එහි කොටස් වටිනාකම කෙරෙහි බලපෑමේ අවදානමයි. වෙළඳපොළ අවදානම කළමනාකරණය කිරීමේ අරමුණ වනුයේ ලාභ ප්‍රශස්ත කරමින් පිළිගත් පරාමිතීන් තුළ වෙළඳපොළ අවදානම් පාලනය හා කළමනාකරණය කිරීමයි. මිල කරණ ප්‍රතිපත්තියට බලපාන සාධක වල ප්‍රවණතා වර්න්වර ඇගයීම මගින් සමාගම අවදානම් අවම කිරීමට පියවර ගනී.

පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල වෙනස්කම් හේතුවෙන් මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහ විචලනය වීමේ අවදානමයි. වෙළඳපොළ පොළී අනුපාත ප්‍රධාන කොටම සම්බන්ධ වනුයේ සංස්ථාවේ දිගුකාලීන ණය බැඳීමට සහ පාවෙන පොළී අනුපාත සහිත ආයෝජනයන්ටය. කෙසේවෙතත්, වාර්තාකරණ දිනයට සැලකිය යුතු පොළී අනුපාත අවදානමක් ඇතිකරන්නා වූ ප්‍රමාණාත්මක දිගුකාලීන පාවෙන අනුපාත ණය ගැනුම් හෝ තැන්පතු සමාගම සතුව නොමැත.